

# වෛශාඛ වර්ණනා

බු.ව.2566 | ක්‍රි.ව.2022

දැවෙන මනු සිත් අමා දහරින් නිවාලනු වස් කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ශිෂ්‍ය සංගමය
විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික විද්‍යුත් දහම් සඟරාවේ දෙවන වෙළුම

# පෙළගැස්ම


1 පරියත්තිය හා පරිවේධය (පිළිවෙත් හා අවබෝධය) ........ 03

2 මූල්‍ය අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය ........ 04

3 සංස්කාරකතුමියගේ පණිවිඩය ........ 05

4 මූල්‍ය ශිෂ්‍ය සංගමයේ වෙසක් පණිවිඩය ........ 06

5 ආගම යනු - පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන් වහන්සේ ........ 07

6 වෛශාක්‍ය දහම් කතිකාවත - පූජ්‍ය මහව ඤාණාලෝක ස්වාමීන් වහන්සේ ........ 08

7 නවමු ඇසකින් වෙසක් දෙස බලන්නට - ජ්‍යෙෂ්ඨ කථීකාචාර්ය අත්තනායක එම්. හේරත් ........ 11

8 බටහිර දාර්ශනිකයන් මුල් බුදුසමය විවරණය කර ඇති ආකාරය - කථීකාචාර්ය රුවන් බුද්ධික ........ 12

9 වෛශාක්‍ය වර්ණනා ........ 14 - 47

10 වෛශාඛ්‍යාර්ථ ප්‍රහේලිකා ........ 48

11 අනුග්‍රාහක භවතුන්ගේ පණිවිඩ ........ 49



මෙහි පළවන ලිපි පිළිබඳව වගකීම එහි රචකයන් සතුය. ඒ පිළිබඳ සංස්කාරකවරුන් හෝ මූල්‍ය අධ්‍යයන අංශය කිසිදු වගකීමක් දරනු නොලබයි.

# පර්යත්තිය හා පටිවේධය
# (පිළිවෙත් හා අවබෝධය)

තිලෝගුරු බුදුපියාණන් වහන්සේගේ ශාක්‍යසිංහ මංගල්‍යයය සමරනු වස් අපගේ ආමිසමය පිදුම "වෛශාක්‍ය වර්ණනාවයි"

කැලණිය විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට මේ දක්වා ම බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් ජාතික මෙහෙවරක් ඉටුකරන මධ්‍යස්ථානයකි. ශ්‍රී ලාංකීය බෞද්ධ පුනරුදයත් සමඟ 1875 වර්ෂයේදී බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ වූ ශ්‍රී විද්‍යාලංකාර පිරිවෙන ලෙස කැලණිය විශ්වවිද්‍යාලයේ සමාරම්භය සටහන් විය. සාම්ප්‍රදායික අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථාන දෙකෙන් එකක් ලෙස පැවති මෙය 1940-1950 දශක තුළ සිදුවූ විශ්වවිද්‍යාල නවීකරණයන් සමඟ "විද්‍යාලංකාර පිරිවෙන", 1959 වර්ෂයේදි "විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය" බවට පත්විය. පසුව 1972 වර්ෂයේදී ලංකා විශ්වවිද්‍යාලය ලෙසත් 1978 වර්ෂයේදී කැලණිය විශ්වවිද්‍යාලය ලෙසත් නාමය වෙනස් විය.

ඓතිහාසික වශයෙන් මෙන්ම වර්තමානයේ ද බෞද්ධ හා පාලි අධ්‍යයනය වෙනුවෙන් කැලණිය විශ්වවිද්‍යාලය විසින් විශිෂ්ට කාර්යභාරයක් ඉටුකරමින් සිටී. දීර්ඝ කාලයක් තිස්සේ පාලි හා බෞද්ධ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සංස්කෘත, වාග් විද්‍යාව, දර්ශනය, සිංහල, පාලි සහ බෞද්ධ පශ්චාත් උපාධි ආයතන තුළින් උගත් විද්‍යාර්ථයන් පිරිසක් දැයට දායාද කරමින් සිටී. ඊට අමතරව විශ්වවිද්‍යාලයේ මව් ආයතනය වූ විද්‍යාලංකාර පිරිවෙන සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති යටතේ ම පාලනය වේ.

මෙවන් වූ බෞද්ධ දහමින් සුපෝෂිත සරසවි මව් තුරුලෙහි සිප් සතර හදාරන මූල්‍ය ශිෂ්‍ය සංගමය වන අපගේ ප්‍රයත්නය වන්නේ, ද්වේශයෙන් පිරුණු, වෛරයේ ගිනි දැල්වලින් දැවෙන මනු සිත් අමා දහරින් නිවා, ලෞකික මිත්‍යාවන්ගෙන් මුදවා අරුත් සම්පන්න තෙමඟුලක් වෙනුවෙන් පෙළගැස්සවීමයි.

වර්තමානයේ රටේ උදා වී ඇති අර්බුදකාරී තත්ත්වයෙන් මිදී දසරාජ ධර්මයන් සුරකින පාලනයක් බිහිවීමටත්, "වෛරයෙන් වෛරය නොසන්සිඳේ" වූ බුදු වදන මුදුන් පමුණුවා ගනිමින්, වෛරය, ක්‍රෝධය වෙනුවට මෛත්‍රිය වැඩෙන්නා වූ සමාජයක් බිහි කිරීමට ප්‍රාර්ථනා පෙර දැරිව අර්ථවත් තෙමඟුලක් සැමරීම වෙනුවෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ශිෂ්‍ය සංගමය විසින් දෙවන වරට එළිදක්වන "වෛශාක්‍ය වර්ණනා" සදහම් සඟරාව ධර්ම දානයක්ම වේවා!!! පින්බර වෙසඟකට ආසිරි!!!




# මූල්‍ය අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය

සමස්ත ලෝක සත්ත්වයා කෙරෙහි ම දයාව, කරුණාව, මෛත්‍රිය පෙරටු කරගත් විශ්ව සාධාරණ සදාකාලික දර්ශනයක් ජනිත කළ, තිලෝගුරු අමා මෑණි බුදුපියාණන් වහන්සේගේ තෙමඟුල සිහිපත් කරන, වෙසක් පුර පසළොස්වක පුන් පොහෝ දිනය සමරනු වස්, නිතැතින් ම බුද්ධ වචනය සිත් දරා කටයුතු කරන, කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය අධ්‍යයන අංශය විසින් දහසක් බාධා මධ්‍යයේ වුවද හදවතින් එකිනෙකා සමඟින් එක්ව, විද්‍යුත් තාක්ෂණය ඔස්සේ ගත් මෙම ප්‍රයත්නය, හද පත්ලෙන් ම අගය කොට සලකමි.

වෛරයේ ගිනි දැල් නිවී සියල්ලන් සුවපත් වන, උතුම් වූ දැහැමියාව රජයන සමාජයක් ඉක්මනින් ම ගොඩනැගෙනු ඇතැයි යන පැතුම ද සමඟින්,
සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවට බැතිබර වෙසක් මංගල්‍යයකට ආසිරි පතමි.

මහාචාර්ය රුවන් අබේසේකර
අංශාධිපති
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය





# සංස්කාරකතුමියගේ පණිවිඩය

නිරන්තරයෙන් ඇඳුරු ඔවදන් අසා දිවියට පසක් කරමින්
සැවොම එක් වී අමා රස වන් දහම් බිඳ බිඳ එකතු කරමින්
වෛශාක්‍ය වර්ණනා ග්‍රන්ථය දොරට වැඩුමට වෙහෙස ගනිමින්
දුවා දරුවනි ඔබේ කැපවුම පැසසුමට ලක් කරමි සතුටින්

තුණුරුවන් සරණින් උතුම් සිරිලක යළිත් පිළිසකර වේවා
රෝග පීඩා වසංගත දුරු වී සැමට සෙත උදා වේවා
සිල් සුවඳ පැතිරී සතන් සිත කුළුණු ගුණයෙන් පහන් වේවා
සුපින්බර තෙමඟුලේ අසිරිය තුළින් නිවනට මග සැදේවා

ඔබ සැමට පින්බර වෙසක් මංගල්‍යයක් වේවා !!!

ගංගා මධුෂානි
කථිකාචාර්ය
මූල්‍ය අධ්‍යයන අංශය



# මූල්‍ය ශිෂ්‍ය සංගමයේ වෙසක් පණිවිඩය

**"තස්සේව තේන පාපියෝ - යෝ කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අප්පටිකුජ්ඣති - සංගාමං ජේති දුජ්ජයං"**

යමෙක් ක්‍රෝධ කරන පුද්ගලයාට පෙරළා ක්‍රෝධ කෙරේ නම්, ඔහු පළමු කිපුනු පාපී පුද්ගලයාට ද වඩා පාපියෙක් වේ. කිපුනු තැනැත්තාට පෙරළා නොකිපෙන තැනැත්තා දිනීමට නම්, ඔහු දුෂ්කර වූ ක්‍රෝධ සංග්‍රාමයෙන් දිනන්නෙක් විය යුතුය.

*තාවකාලික නැවතුමක කුමටද*
*ද්වේශ ලෝභ මෝහ වපුරමින්*
*නිවනට බැමි තනන්නේ...*
*එතෙර වන්නට ඝෝර සසරින්*
*ලැබුන මේ මිනිසත් බවය තුළ...*
*මෛත්‍රී, කරුණා ලොව*
*සිත් සතන් වපුරන්නට කල් ඇති කල...*
*දෙලොව පින්කෙත් වපුරනු වස්...*
*බුද්ධ වචනයෙන් සුපෝෂිතව*
*උතුම් වූ තෙමඟුල සමරන්නටයි මේ ඇරයුම....*

රටෙහි පවතින ආර්ථික අර්බුදය හමුවේ
ක්ලේශමූලයෙන් විඩා වූ දනන් සිත් බුදුන් දහමින් සුවපත් වන පින්බර තෙමඟුලක් වේවා!

මූල්‍ය ශිෂ්‍ය සංගමය
මූල්‍ය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# ආගමක් යනු,

ආගම යනු කුමක්දැයි ප්‍රශ්න කිරීමට හා විවරණය කිරීමට සිදුවීම වාසනාවන්ත තත්ත්වයක් නොවේ. මේ මාතෘකාවෙන් ලිපියක් ලියන්නට සිදුවීමෙන් පෙනෙන්නේ ආගම යනු කුමක්දැයි නොදන්නා පිරිසක් අද සිටින බව ය. ආගම කණ්ඩායම්වාදයට, කල්ලිවාදයට හෝ වෙනත් සමාජ උපකුලයකට සතුවීම හෝ ලඝුවීම මෙබන්දක් සාකච්ඡා කරන්නට හේතුව වන හෙයිනි. අද වන විට ශ්‍රී ලාංකේය සමාජ දේහය විජාතික කුලී ත්‍රස්තවාදී අර්බුදයෙන් ඔත්පලව සිට යාන්තම් සුව අතට පත් කළේ දැවැන්ත ශල්‍යකර්මයකින් පසුව ය. තාමත් ශල්‍යකර්මයේ තුවාල සුව නොවූ තත්ත්වයක් තුළ එම දේහයට ම තවත් ආගමික උණ රෝගයක් වැළඳුනහොත් සුවකිරීම අසීරු වනු ඇත. එහෙයින් මෙම නව ආගමික අර්බුද නම් වන ප්‍රවණතාව ගැඹුරින් හා ශාස්ත්‍රීය ව සාකච්ඡා කළ යුතුව ඇත. ආගම යන්න පැරණි කාලයෙහි පාඨග්‍රන්ථ යන අර්ථයෙන් භාවිතව තිබේ. දීඝාගම, මජ්ඣිමාගම, සංයුත්තාගම ආදි වශයෙනි. එහෙත් අද වන විට ආගම් යන්න භාවිතා වන්නේ කිසියම් ශාස්තෘවරයෙකු විසින් ආගමික මාධ්‍යයෙන් කරන ලද ප්‍රකාශ, වත්පිළිවෙත් සමූහයකින් සමන්විතව භාවිත කිරීමට යි.

ආගම, දර්ශනයක් සහිත ව ද රහිත ව ද යෙදෙනු දැකිය හැකිය. දාර්ශනික ආගම් ද ආගමික දර්ශන ද දැකිය හැකි අතර, ආගමික නොවන දර්ශන හා දාර්ශනික නොවන ආගම් ද ඒ අතර තිබීම සැලකිය යුත්තකි. ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සොක්‍රටීස් ආදීහු නව දර්ශන ලොවට ඉදිරිපත් කළාහු ය. එහෙත් ඔවුන්ගේ මෙකී දර්ශනයන් ආගම් තත්ත්වයකට පත්වූයේ නැත. ඊට හේතුව මෙහි ඇති දාර්ශනිකභාවය වඩාත් තහවුරු කරනු වස් ආගමික අභිචාර - උපචාර විධීන් එහි නොවීමයි. තවත් විධියකින් කිවහොත් දාර්ශනික ප්‍රස්තුතයන් හැර එහි ආගමික මුහුණුවරක් නොතිබීම යි. ආගමික මුහුණුවරෙහි නොමැති දර්ශනයක් පවතින්නේ හුදෙක් දර්ශනයක් වශයෙන් පමණි. එකී දර්ශනය චිරකාල පැවැත්මකට යොමු කිරීමට නම් ඊට අනුශාංගික වූ අභිචාර - උපචාර සහිත වත්පිළිවෙත් අවශ්‍ය වීම සමාජීය සිද්ධාන්තයකි. සොක්‍රටීස්, ඇරිස්ටෝටල් ආදීන්ගේ ගාම්භීර දාර්ශනික ප්‍රස්තුතයන් වත්පිළිවෙත් වලින් සරසා නැත. එහෙත් කාල්මාක්ස් ගේ සමාජ - දේශපාලනික දර්ශනය තරමක අභිචාර - උපචාර විධීන්ගෙන් සැරසී තිබෙනු දැකිය හැකිය. මාක්ස්වාදය ප්‍රායෝගික කරනු සඳහා කටයුතු කළ ලෙනින් ආදීන් පක්ෂයක්, ලාංඡනයක්, වර්ණයක්, ධජයක්, හිස්වැසුම්, සටන් පාඨ, ආමන්ත්‍රණ විධීන් වැනි අභිචාර හා උපචාර විධීන්ගෙන් කාල්මාක්ස් දර්ශනය ප්‍රයෝගීකරණය කර ඇත. මාක්ස්වාදය ආගමක් නොවුණ ද ඊට අදාළ වන ආගමික ලක්ෂණ ඇත්තේම නැතැයි තර්ක කිරීමට නොහැකි තරම් මෙකී දේශපාලන හා ආගමික දර්ශන සමාජගත වී ඇත. මෙය කිසියම් දර්ශනයක් ආගමික ලක්ෂණ වලින් සමන්විත කරවනු සඳහා කළ නූතන දර්ශනයක් හෝ ඉගැන්වීමක් හෝ දිගට ම පවත්වා ගෙන යා හැක්කේ ඊට අනුශාංගික වූ ආගමකිනි. නැතහොත් ආගමික දර්ශනයකිනි. සැබවින්ම ආගමක් ලෙස වැඩුනු දාර්ශනික දේශනාවකිනි. එසේ වන්නේ ඉහත කී දාර්ශනික ප්‍රකාශයන්ගේ චිරකාල පැවැත්ම උදෙසා අනුප්‍රාප්තිකයන් විසින් එය ආගමික මුහුණුවරකින් සංරක්ෂණය කරනු ලැබ ඇති හෙයිනි.

තථාගතයාණන් වහන්සේ ඇති කර වදාළ භික්ෂු සංස්ථාව ද, ආරාමික සම්ප්‍රදාය ද, විනය පිටකය ද, හැරුණු කොට භික්ෂු සංස්ථාව විසින් ඇති කර ගනු ලැබ ඇති ආගමික සම්ප්‍රදායන් ද ඉහත කී දාර්ශනික ප්‍රකාශයන් රැකගනු සඳහා කළ අභිචාර - උපචාර විධීන් ය. දා කරඬුවක් මැනවින් මල්කම්, ලියකම් ආදියෙන් සැරසුව ද සැබවින් ම එහි අපේක්ෂණය වන්නේ ධාතූන් වහන්සේගේ ආරක්ෂාව ම ය. ආගම ද එමෙන් ම ගාම්භීර දාර්ශනික ප්‍රස්තුතයන් රැකගනු වස් කෙරෙන විසිතුරු රැකවලක් පමණි. නූතනයේ ආගම් ඇතැම් විට භාවිත වන්නේ ඉහත කී දාර්ශනික විග්‍රහයකින් ලෝකය දැකීමට නොවේ. එසේ ම ඇතැම් ආගමික චර්යාවන්ගෙන් මිනිස් චර්යාවන් ශිෂ්ට සම්පන්න කිරීම ද සිදුනොවේ. අවම වශයෙන් හීලෑ කිරීම ද සිදුනොවේ. එසේ නම් ආගමික භාවයක් හෝ ආගමික නාමයක් කුමන අරමුණක් උදෙසා භාවිත වන්නේ ද යන්න සලකා බැලිය යුතු කරුණකි. ඇතැම් ආගම් පාවිච්චි වන්නේ තම බලාධිකාරය පවත්වාගෙන යාම සඳහා ය. එහෙයින් දෙවියන් ඉදිරියේ මිනිසුන් හීලෑ කරමින් ලෝක දේශපාලනික අරමුණු සාක්ෂාත් කරගනු සඳහා ඇතැම් ආගම් විසින් ඉටු කරනු ලැබීම, කනගාටුවට කාරණයකි. ආගමික වටිනාකම සංඛ්‍යාත්මකව මැනීම ම හුදෙක් දේශපාලනික වූ සිතුවිල්ලකි.

සිය ආගමික සාමාජිකයා රටේ බහුතරය කිරීම යන්න ආගමික අරමුණක් නොව, දේශපාලනික අරමුණක් හා බැඳුනකි. එහෙයින් සංඛ්‍යාත්මක ප්‍රවර්ධනය උදෙසා ද භූමිය අල්ලා ගනු උදෙසා ද ආගමික ව්‍යාපාරයක් ක්‍රියාත්මක වන්නේ නම් බුදුසමය හා සාපේක්ෂ ව බලද්දී එය ආගමක් ලෙස හැඳින්වීම ම කොතරම් ආචාරශීලී දැයි විමසා බැලිය යුතු ව ඇත. ඉහත නිර්ණායක අනුව සම්බුද්ධ දේශනාව දාර්ශනික ආගමක් ලෙස හඳුන්වාලිය හැකි මුත්, නූතන ශ්‍රී ලාංකේය ඇතැම් ආගම් ඒවා පරමාර්ථ වශයෙන් ආගමික හෝ දාර්ශනික හෝ දැයි ඔවුන් ම යෝනිසෝමනසිකාරයෙන් මැදිහත් ව සිතා බැලීමට තරම් නිහතමානී විය යුතුය.

රාජකීය පණ්ඩිත, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,
අතිපූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# වෛශාක්‍ය දහම් කතිකාවත

ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන සමාජීය - ආර්ථික තත්ත්වය පිළිබඳ බුදුදහමට අනුකූලව පැහැදිලි කිරීමක් ලබා ගැනීම අරමුණු කරගෙන මෙම ධර්ම සාකච්ඡාව පවත්වන ලද අතර එහි දී ධර්ම විවරණයන් ඉදිරිපත් කරන ලද්දේ,

මහාවිහාරවංශාලංකාර, පර්යාප්ති විශාරද, සද්ධර්ම කීර්ති ශ්‍රී සංඝසෝභන, රාමඤ්ඤවංශප්‍රදීප ධර්ම ශාස්ත්‍ර ශිරෝමණී, ධර්ම කීර්ති ශ්‍රී, ත්‍රිපිටක විශාරද, විද්‍යාවේදී, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත පූජ්‍ය මහව ඤාණාලෝක ස්වාමීන් වහන්සේ.

**01. ගෞරවනීය ස්වාමීන් වහන්ස, අපේ මේ ධර්ම සාකච්ඡාව පවත්වන්නට තීරණය කළේ ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී ඇති සමාජීය - ආර්ථික වාතාවරණය පිළිබඳ බෞද්ධ දර්ශනයට අනුව පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා. එහෙත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය නිවන් දැකීම අරමුණු කරගත් දෙයක්. ඒ නිසා පළමුවෙන් ම අපි පැහැදිලි කර ගැනීමට කැමතියි, නිවන් දැකීම සඳහා ධර්මය දේශනා කළ බුදුරජාණන් වහන්සේ මේ සමාජීය - ආර්ථික තත්ත්වයන් පිළිබඳ වත් දේශනා කර තිබෙනවා ද?**

ඇත්තෙන් ම ඔව්. බුද්ධ දේශනාව එක ම එක විමුක්ති රසයක් තියෙන දේශනාවක්. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ වදාළ සෑම දේශනයක ම නිවන් රසයයි ගැබ් වෙලා තියෙන්නේ. එකෙන් කියවෙන්නේ බුදුරජාණන් වහන්සේ සමාජීය - ආර්ථික තත්ත්වයන් පිළිබඳ ව ධර්මය දේශනා නො කළා කියලා නෙවෙයි.

බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළේ නිවන අරමුණු කරගෙන වුවත් ඒ නිවනට උපකාරී වන ජීවිතය සකස් කර ගැනීම පිළිබඳව උන්වහන්සේ දේශනා කළා. විශේෂයෙන් ම සිඟාලෝවාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය වාගේ සූත්‍රවලින් හෙළි වන්නේ බුදුරජාණන් වහන්සේ මිනිසුන්ගේ සමාජීය - ආර්ථික දියුණුවට කළ මඟ පෙන්වීම්.

කොසොල් රජතුමා, බිම්බිසාර රජතුමා වැනි රජවරු නිතරම බුදුරජාණන් වහන්සේ මුණගැසුණා. ඔවුන්ට දේශනා කළ ධර්මයන් තුළින් හෙළි වෙනවා බුදුරජාණන් වහන්සේ ධාර්මික රාජ්‍ය පාලනයට කළ අනුග්‍රහය. ලිච්ඡවි රජ දරුවන්ගේ සප්ත අපරිහාණීය ධර්ම පිළිබඳව බුදුරජාණන් වහන්සේ වස්සකාර මගධ මහාමාත්‍යයාට දේශනා කරන්නේ සමස්ත සමාජයට ම එයින් වන යහපත ගැන සලකලා.

දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ සක්විති රජ කෙනෙක් වීමට සම්පූර්ණ කළ යුතු සක්විති වත් සඳහන් වෙනවා. එහි දැක්වෙනවා ඒ වත් සම්පූර්ණ නොකිරීම නිසා සක්විති රජවරුන්ගේ පරම්පරාව සිඳී ගිය ආකාරය. ඒ වාගේම ධාර්මික සමාජය ක්‍රමයෙන් අධාර්මික වෙලා මිනිසුන්ගේ ආයුෂ අඩු වූ ආකාරය මෙහි සඳහන් වෙනවා.

මේ නිසා බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් නිවන අරමුණු කර ගෙන නමුත් සමාජීය - ආර්ථික සංවර්ධනය ගැනත් අවධානය යොමු කර ගෙන ගිහි පිරිසට ධාර්මික ව ජීවිතය ගෙන යන ආකාරය පිළිබඳ වත් ධර්මය දේශනා කළ බවයි හෙළි වන්නේ.

**02. බුදුරජාණන් වහන්සේ මේ ලෞකික දියුණුව පිළිබඳ ව, සමාජීය - ආර්ථික යහපැවැත්ම පිළිබඳ ව කළ මඟ පෙන්වීමක් උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කළොත්.**

බුදුරජාණන් වහන්සේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ දේශනා කරනවා සක්විති වත් දහයක් පිළිබඳව. අතීතයේ දැහැමි සක්විති රජවරුන් සිටි කාලයේ ඔවුන්ගේ ධාර්මික රාජ්‍ය ධර්ම දහයක් මෙයින් දැක්වෙනවා.

1. දස කුසලපථ ධර්මය ම ඇසුරු කරගෙන, ධර්මයට ම සත්කාර කරමින්, ධර්මයට ම ගරු කරමින්, ධර්මයට ම බුහුමන් කරමින්, ධර්මය ම පුදමින්, ධර්මයට ම යටහත් පැවතුම් දක්වමින්, ධර්මය ම පෙරටු කොට ගෙන, සෑම කටයුත්තක් ම දස කුසලකර්මපථ වශයෙන් ම සිදු කරමින් පුත්‍රදාරාදි ඇතුළු ජනයා කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

2. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා බල සේනාව කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

3. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා යටත් වූ ක්ෂත්‍රියයන් කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

4. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා අනුයුක්තිකයන් කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

5. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

6. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා නියම්ගම් වැසි ජනතාව කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

7. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා මහණ බමුණන් කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

8. එසේ දස කුසල කර්මපථය ම ඇසුරු කරගෙන ඒ ධර්මයෙහි ම පිහිටා මෘගපක්ෂීන් කෙරෙහි ධාර්මික රක්ෂාවරණය සැලසීම.

9. තමන්ගේ විජිතයෙහි අධර්ම ක්‍රියා නොපවත්නා ලෙසට කටයුතු සංවිධානය කිරීම.

10. රටෙහි ධනය නැති දිළින්දන්ට ධනය දීම.

මේ සක්විති වත් ආරක්ෂා කරමින් රාජ්‍ය පාලනය කිරීමේ දී රටවැසියන් ධාර්මික වෙනවා. රජතුමා විසින් සියලු රටවැසි පුද්ගලයන් කෙරෙහි ම ධාර්මික ආරක්ෂාවක් සලසා තිබෙන නිසා.

මේ සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එක්තරා සක්විති රජ කෙනෙකුගේ පුත්‍රයා තම පියාගේ ඇවෑමෙන් මේ සක්විති වත් ආරක්ෂා කරන්නේ නැතිව තමන් කැමැති කැමැති විදිහට රට පාලනය කරනවා. පසුව ඇමතියන්ගේ මෙහෙයවීමෙන් වත් නවයක් ආරක්ෂා කරන්න පටන් ගන්නවා. ඒත් අවසාන දිළින්දන්ට ධනය දීම කියන වත ආරක්ෂා කරන්නේ නෑ.

ඒ නිසා දිළිඳු ජනතාව සොරකම් කරන්න පටන් ගන්නවා. සොරකම් කරන අයට රජු ධනය දුන්නා. ඒ නිසා සොරකම වැඩි වුණා. ඊළඟට සොරුන් හිස ගසා දමන්න අණ කරනවා. එතනින් තමයි ලෝකයේ පළමුව ම දණ්ඩ නීතියක් ආරම්භ වන්නේ. සොරුන්ගේ හිස ගසා දමන බව අහන්න ලැබෙන මිනිස්සු තියුණු ආයුධ සකස් කරගෙන තමනුත් සොරුන් ඝාතනය කරන්න පටන් ගන්නවා. මේ විදිහට දිළිඳු ජනයාට ධනය නොදීම නිසා දිළිඳු බව වැඩි වෙලා සොරකම ඇති වෙලා තියුණු අවි - ආයුධ භාවිතය ඇති වෙලා ප්‍රාණඝාතය ඇති වූ බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. ඒ ප්‍රාණඝාතය නිසා මිනිසුන්ගේ ආයුෂ, වර්ණය ආදිය පිරිහී ගිය බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

මේ විදිහට බුදුරජාණන් වහන්සේ සමාජයේ යහපැවැත්ම පිණිස හේතුවන කරුණු දේශනා කරමින් ධාර්මික සමාජයක් ගොඩනැගීමට මඟ පෙන්වූ බව පැහැදිලි වෙනවා.

**03. ස්වාමීන් වහන්ස, අපට මේ උදාහරණ වලින් පැහැදිලි වන දෙයක් තමයි අතීත රජදරුවන් ධර්මයෙන් ම රාජ්‍ය පාලනය සිදු කළ බව. එහෙත් වර්තමානයේ දී, එම තත්ත්වය හාත්පසින් ම වෙනස් වී සියල්ල අක්‍රමවත් ස්වභාවයක් ගැනීමට හේතුව කුමක් විය හැකි ද?**

ඒක ඉහත චක්කවත්ති සීහනාද සූත්‍රයෙන්මත් පැහැදිලි වෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රජු අධාර්මික වෙනකොට රටවැසියෝ අධාර්මික වන බව.

මේක ලෝක ස්වභාවය. ක්‍රමයෙන් පිරිහීමට පත්වීම. බුදුරජාණන් වහන්සේ වදාළේ ඒ සක්විති රජවරුන්ගේ කාලයේ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු අසූ දහසක් බව. ප්‍රාණඝාතය ආරම්භ වීමත් සමඟ ආයුෂ අවුරුදු හතලිස් දහසට අඩු වුණා. ප්‍රාණඝාතයෙන් පසුව බොරු කීම, ඉන් පසුව කේලාම් කීම, අනතුරුව කාම මිත්‍යාචාරය, ඉන් පස්සේ හිස් වචන කීම, එතනින් අභිධ්‍යාව කියන දැඩි ලෝභය, එතැනින් මිත්‍යා දෘෂ්ටිය, අනතුරුව අධර්ම රාගය, විෂම ලෝභය, මිත්‍යා ධර්ම යනුවෙන් මිනිසුන් පරිහානියට පත් වූ ආකාරය බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

ඒ අනුව අනාගතයේ මේ විදිහට ම මිනිසුන් අධාර්මික වෙලා ආයුෂ පිරිහීගෙන ගිහින් දසවස් ආයු ඇති කාලයක් එන බව මේ සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

මේ නිසා මේ සිදුවන්නේ මේ පිරිහීම යි. අතීත රජවරු ධර්මයෙන් ම රට පාලනය කළා. නමුත් ක්‍රමක්‍රමයෙන් රජවරු අධාර්මික වෙලා රටවැසියෝත් අධාර්මික වෙන්න පටන් ගත්තා. ඒ අනුව මුළු සමාජය ම අධාර්මික වෙමින් පවතිනවා. මෙය තවත් බොහෝ සෙයින් පිරිහීමට පත් වෙනවා.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ දසවස් ආයු ඇති කාලයේ සත්ත්ව විනාශයක් සිදු වෙනවා. තරමක් හෝ ධාර්මික මිනිස්සු එහි දී ඉතිරි වෙනවා. ඒ අය තමන්ගේ අඩුපාඩු නුවණින් සලකලා ප්‍රාණඝාතාදියෙන් වැළකී ඉන්නවා. ඒ අනුව නැවතත් ආයුෂ වැඩි වෙලා ධාර්මික සමාජයක් ගොඩනැගෙන බව දේශනා කරනවා. ඒ නිසා අපි හැමෝම නුවණින් කල්පනා කරගෙන තමන් ධර්මානුකූල ප්‍රතිපදාවට යොමු වීමයි වැදගත් වන්නේ. අන් අයගේ දොස් සෙවීමෙන් කිසිදු ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ.

**04. ස්වාමීන් වහන්ස, වර්තමානයේ දී ප්‍රභූවරුන්, සාමාන්‍ය ජනයා ඇතුළුව, මුළු මහත් සමාජයේ ම වී ඇති පිරිහීම බුදුරජාණන් වහන්සේ, කොසොල් රජු දුටු සිහින දහසය විවරණය කළ ආකාරයෙන් පැහැදිළි කළහොත්.**

වර්තමාන සමාජයේ සිදු වී ඇති පිරිහීම පිළිබඳව හොඳින් ම විස්තර වන බුදුරජාණන් වහන්සේගේ දේශනාවක් තමයි කොසොල් රජු දුටු සිහින පිළිබඳ දේශනාව.

දිනක් කොසොල් රජු රාත්‍රී පශ්චිම යාමයේ දී පමණ මහා සිහින දහසයක් දුටුවා. මේ සියල්ල විස්තර කළොත් විශාල දේශනයක් වෙනවා. මේ සිහින පිළිබඳ විස්තර කළ බුදුරජාණන් වහන්සේ වදාළේ අනාගතයේ ලෝකයේ ජන සමාජයේ සිදුවන පිරිහීම මෙම සිහිනවලින් නිරූපණය වන බව.

එක් උදාහරණයක් සලකා බැලුවොත්, කොසොල් රජතුමා දකිනවා සිහිනයක්, එක්තරා ගැල් වාහකයෙක් ඒ කියන්නේ කරත්තයක් දක්කාගෙන යන කෙනෙක් ශක්තිමත් ගොනුන් සිටිය දී ඔවුන් කරත්තයේ නො යොදා තරුණ, ළදරු ගොනුන් කරත්තයේ යොදවනවා. ඔවුන්ට කරත්තය ඇදගෙන යා නොහැකිව එකම තැන නතර වී සිටිනවා.

මේ සිහිනය විවරණය කරන බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අනාගතයේ අධාර්මික රජවරුන්ගේ කාලයේ නුවණැති, පරිණත මහාමාත්‍යාදීන්ට පිරිවර සම්පත් නොදී, නුවණැති පළපුරුදු තැනැත්තන් විනිශ්චයස්ථානයන්හි නොයොදා තරුණ, අත්දැකීම් අඩු, අපරිණත තැනැත්තන්ට පිරිවර සම්පත් දී රාජ්‍ය පාලනයට සම්බන්ධ කරගන්නවා. ඔවුන් රාජ්‍ය කර්මාන්ත, යුතු - අයුතු දේ ගැන නො දැන රාජ්‍යයේ කටයුතු අසාර්ථක වෙනවා. අත්දැකීම් බහුල පරිණත නායකයන් ද තමන්ට අනුග්‍රහයක් නොමැති හෙයින් රාජ්‍ය පාලනයට මැදිහත් නොවී සිටිනවා. එයින් සියලු රාජ්‍ය තාන්ත්‍රණය පිරිහෙනවා.

අද මෙම තත්ත්වය ඇති වී තිබෙනවා. රටක පාලන තන්ත්‍රය ගැන වාගේ ම සමාජීය - ආර්ථික දියුණුව ගැන හොඳ අවබෝධයක් තියෙන පරිණත පුද්ගලයන් රටේ සිටිනවා. නමුත් රාජ්‍ය පාලකයන් ඒ අයගේ උදව් උපකාර ගන්නේ නැතිව අපරිණත තැනැත්තන්ට තම තමන්ගේ පෞද්ගලික ලාභ ප්‍රයෝජන තකා රාජ්‍ය කටයුතු භාර කරනවා. ඒ අනුව සමාජීය - ආර්ථික වශයෙන් පිරිහීමක් ඇති වෙනවා.

**05. ගෞරවනීය ස්වාමීන් වහන්ස, ඉතිහාසය දෙස බලන විට ඈත අතීතයේ සිට ම රටේ පාලකයාට උපදෙස් දෙන, නිවැරදි මාර්ගය පෙන්වන වැදගත් කාර්යභාරය මහා සංඝරත්නය විසින් ඉටු කළ බව දක්නට ලැබෙනවා. එහෙත් වර්තමානයේ මෙම සංඝයා වහන්සේලාගේ වගකීම කොතරම් දුරට ඉටු වෙනවා ද කියන එක විමසා බැලිය යුතුයි. මේ ගැන ඔබ වහන්සේගේ අදහස කුමක් ද?**

ඇත්තෙන් ම අතීතයේ දැහැමි පාලකයන්ට අවශ්‍ය උපදෙස් දීම භික්ෂූන් වහන්සේලා අතින් සිදු වුණා. ඒ බව ඉතිහාසය දෙස බලන විට අපට හොඳින් පෙනෙන අවස්ථා තිබෙනවා. එහෙත් ඒ දැහැමි රජවරුන්ගේ මහා සංඝරත්නයේ උපදෙස් බලාපොරොත්තු වූ තත්ත්වයකයි. අතීතයෙත් හිටියා අධාර්මික රජවරු. ඒ අය භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් ගත්තේ නැහැ. උපදෙස් ඉල්ලන්නේ නැතිව මහා සංඝරත්නය උපදෙස් දෙන්න ගියෙත් නෑ. ඒක භික්ෂූන් වහන්සේලාට අයත් කටයුත්තක් නොවන නිසා.

අනෙක් කාරණය තමයි වර්තමානය වන විට සමාජය පිරිහීමත් සමඟ භික්ෂු සංස්ථාවත් ශීඝ්‍රයෙන් පිරිහීමට පත් වෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ නෑ ග්‍රාමවාසී, ආරණ්‍යවාසී කියලා දෙපිරිසක් ගැන. නමුත් සංඝ සංස්ථාව මේ සමාජීය කටයුතුවලට මැදිහත් වන ආකාරය අනුව එහෙම බෙදීමක් ඇති කරගෙන තියෙනවා නේ. ඒ අනුව රාජ්‍ය පාලනය ආදියට මැදිහත් වීම, ඒවාට උපදෙස් දීම ආදිය ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලාගේ කටයුත්තක් ය, ඒ සියල්ලෙන් ම වෙන් ව නිස්සරණය වෙනුවෙන් කටයුතු කිරීම ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාගේ කටයුත්තක් ය කියලා සමාජය බෙදාගෙන ඉන්නවා.

නමුත් සෑම භික්ෂුවක් ම පැවිදි වන්නේ 'සබ්බදුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡිකරණත්ථාය' කියලා සියලු දුකින් අතමිදෙන නිවන සාක්ෂාත් කර ගැනීමට. ඒ නිස්සරණය උදෙසා ශීලය ආරක්ෂා කිරීම, ප්‍රතිපත්ති පූරණය සියලුම භික්ෂූන් වහන්සේලාට අයත් දෙයක්. ඒ ප්‍රතිපත්ති පූරණයේ දී රටේ රජතුමා ධාර්මික උපදෙසක් බලාපොරොත්තු වෙනවා නම් ධාර්මික පසුබිමක උපදෙස් දීම භික්ෂුව කළ යුතුයි. එහෙත් අධාර්මික උපදෙස් දීම නොකළ යුතුයි.

මේ නිසා වර්තමානයේ ත් ශීලය මැනවින් ආරක්ෂා කරන, ප්‍රතිපත්ති පුරණ භික්ෂූන් වහන්සේලා බොහෝ පිරිසක් ඉන්නවා. නමුත් රාජ්‍ය පාලකයන් උපදෙස් ගත්තත් ඒ අයගෙන් උපදෙස් ගන්නේ නැහැ. ඒ නිසා මහා සංඝරත්නයේ වගකීම ඉෂ්ට නොවෙනවා කියන්න බැහැ.

**06. බුදු දහම ගැන පමණක් නො වේ, සමාජ - ආර්ථික තත්ත්වයන් පිළිබඳවත් අත්දැකීම් ඇති භික්ෂුවක් ලෙස, විශේෂයෙන් ම ගිහි කළ ආර්ථික විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍ර පරිශීලනය කර ඇති අත්දැකීම් ආදියත් සමඟ මේ ගෙවෙන දුෂ්කර කාලයේ මිනිසුන්ට ලබා දිය හැකි අවවාදය කුමක් ද?**

ධර්මානුකූල වීම තමයි එක ම අවවාදය.

ධර්මානුකූල වීම ආකාර දෙකකට සලකා බැලිය හැකියි. සමාජීය - ආර්ථික වශයෙන් බුදු දහම අනුව ගෙවෙන ජීවිතයක් ඇති කර ගැනීම. අනෙක් කාරණය ආධ්‍යාත්මික වශයෙන් දියුණුවක් ඇති කර ගැනීම.

සමාජීය - ආර්ථික දියුණුව උදෙසා බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් ම දේශනා කළ සූත්‍රයක් තමයි ව්‍යග්ඝපජ්ජ සූත්‍රය. එහි දී බුදුරජාණන් වහන්සේ දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කරනවා මෙලොව යහපත් පිණිස හේතු වන ධර්මතා සතරක් පිළිබඳව. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා කියලා.

තමන් කරන කෘෂි, වාණිජ ආදි කවර හෝ කර්මාන්තයේ දක්ෂ ලෙස, අලස නො වී යෙදීම උට්ඨාන සම්පදාව කියන්නේ. ධාර්මිකව උපයන ලද ධනය පිළිබඳ ධාර්මික රැකවරණය යෙදීමයි ආරක්ඛ සම්පදා කියන්නේ. ශ්‍රද්ධාවන්ත, ශීලවන්ත, ත්‍යාගවන්ත, ප්‍රඥාවන්ත වූ පුද්ගලයන් ඇසුරු කිරීම කල්‍යාණමිත්තතා. තමන්ගේ අය සහ වැය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ඊට ගැළපෙන ආකාරයෙන් සම දිවි පැවැත්මක් ගත කිරීම සමජීවිකතා කියන්නේ. තමන් උපයන භෝගයන් විනාශ කරන දේ සහ ඒවා ආරක්ෂාකර දෙන කටයුතු පිළිබඳ මෙහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

මේ ධර්ම අවවාදයන් අනුව කටයුතු කිරීම වර්තමානයේ ඇති වී තිබෙන අර්බුද බොහොමයකට විසඳුම වෙනවා. ඒ වාගේ ම අධ්‍යාත්මික වශයෙනුත් මේ වාගේ දුෂ්කර කාලයක තමන්ගේ චිත්ත ශක්තිය වර්ධනය කරගන්න ඕනේ.

විශේෂයෙන් ම මෙකල බොහෝ දෙනෙක් ද්වේශය ආදි අකුසල ධර්මයන් සමඟ සිටින බව යි පෙනෙන්නේ. ඒ තත්ත්වයන් පාලනය කර ගෙන මෛත්‍රිය වාගේ කුසල ධර්මයන් නිරන්තරයෙන් සිතේ ඇති කරගත යුතු යි. එක් අයෙක් ද්වේශ සිත් ඇති කර ගන්නා විට අනෙක් අයත් ඒ ද්වේශය ම ඇති කර ගැනීමෙන් සියලු ම දෙනා විනාශයට පැමිණේ. අනෙක් අය ද්වේශ කරන අවස්ථාවක තමන් හෝ මෛත්‍රිය ඇති කර ගන්නේ නම් එයින් සියලු දෙනාට යහපත උදා කර ගත හැකි වේ.

මේ විදිහට තමන්ගේ ජීවන රටාව ධර්මානුකූලව සකස් කරගනිමින් ආධ්‍යාත්මික දියුණුවක් ද ඇති කරගැනීමයි මේ කාලයේ කළයුතු වන්නේ.

මහාවිහාරවංශාලංකාර, පර්යාප්ති විශාරද, සද්ධර්ම කීර්ති ශ්‍රී සංඝසෝභන, රාමඤ්ඤවංශප්‍රදීප ධර්ම ශාස්ත්‍ර ශිරෝමණී, ධර්ම කීර්ති ශ්‍රී, ත්‍රිපිටක විශාරද, විද්‍යාවේදී, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත පූජ්‍ය මහව ඤාණාලෝක ස්වාමීන් වහන්සේ.



# නවමු ඇසකින් වෙසක් දෙස බලන්නට

බහුතර ජනතා මතය වී ඇත්තේ වෙසක් උත්සවය සිංහල රජ දවස පටන් අද දක්වා අඛණ්ඩව බොහොම උත්සවශ්‍රීයෙන් පවත්වන්න ට ඇති බවයි. නමුත් එය එසේ සිදු නොවන්නට ඇතැයි, වර්ෂ (1905) ට පෙර සයිමන් ද සිල්වා මහතා නවකතා ලිවීමට පෙර යුගයේ අයිසැක් සිල්වා සහ ඇල්බට් සිල්වා නමින් දෙදෙනෙක් ප්‍රසිද්ධ කළ නවකතා ද්විත්වයකින් මේ පිළිබඳ අපූරු සාක්ෂියක් විද්‍යමාන වේ.

ඇල්බට් සිල්වා මහතා විසින් රචිත ග්‍රන්ථයෙහි කතෝලික ආගම අදහන පුද්ගලයින් දියුණු බවත්, අන්‍යාගමිකයින් 'කාලකන්නි' ලෙස හැඳින්වීමත් දක්නට ලැබේ. එසේම අයිසැක් සිල්වා මහතා ලියූ වෙසක් දූතයා නම් ග්‍රන්ථයෙහි උපුටාගත් කොටසක් ලෙස, "හැම පරවියෙකුම කකුල්වල දැන්වීමක් අලවලා යවමු, වෙසක් උත්සවය පවත්වපල්ලා..!" දැක්විය හැකිය. කතෝලික පල්ලියෙහි බලපෑම මෙම ග්‍රන්ථ දෙකෙන්ම පැහැදිලිව ඉදිරිපත් කරන අතර කතෝලික පල්ලිය සමග එකට එක කිරීමට බෞද්ධයින්ගේ පෙළඹවීම ක් අයිසැක සිල්වාගෙ පොතට අනුව ගම්‍ය වේ. මේ අනුව පැහැදිලි වෙන්නේ සාමාන්‍ය ලාංකික ජන සමූහයා වර්ෂ (1915) ට පෙර වෙසක් උත්සවය සැමරිය යුතුය යන උනන්දුවෙන් නොසිටි බවයි.

මෙවන් යුගයක ලාංකික වෙසක් සංස්කෘතිය පුබුදු වීමෙහි ලා පියදාස සිරිසේන මහතා, අනගාරික ධර්මපාලතුමා, ඕල්කට්තුමා වැනි මහතුන්ගේ මැදිහත් වීම එවකට විශාල පිටිවහලක් බවට පත් විය. මෙවන් මැදිහත්වීමක් සමග ඇති වූ වෙසක් ප්‍රබෝධයෙහි තවත් එක් හේතුවක් නම්, යේසුස් වහන්සේගේ සුරුවම් කතෝලික බලය පැවැති ප්‍රදේශවල ඉදිකිරීම ඇරඹීම යි. එදා අපේ මුතුන් මිත්තන්, පැරණි රජවරුන් වටපිටාව අධ්‍යයනය කර ගල් කුළු මත විරාජමාන වන්නට ඉදි කල බුදු පිළිම එතැන් සිට නගරවලට සහ හන්දිවල ට වඩමවමින් හුදෙක් ම කතෝලික පල්ලි සමග එකට එක කිරීමක් වශයෙන් බුද්ධ ප්‍රතිමා ද ඉදිවන්නට පටන් ගැනුණි.

වර්තමානය වන විට ද ලාංකික බෞද්ධයා නත්තල් උත්සවය සැමරීම දක්නට ලැබෙන සුලබ දසුනකි. මිෂනාරි බලපෑම පැවැති එකල මෙය අබෞද්ධයන්ගේ ක්‍රියාවක් ලෙස සැලකුව ද දැන් එය බෞද්ධයන්ට සාමාන්‍ය දෙයකි. වෙසක් දින පහන් කූඩුවක් එල්ලා, නිවස තුළ පහනක් දල්වා බුදුරදුන්ට උපහාර කරන කිතුනුවන් දුලභ වුවද නත්තල් දිනට, නත්තල් ගසක් නිවසට ගෙනැවිත් තෑගි බෝග බෙදා දී, නත්තල් සමරන බෞද්ධයින් නම් රාශියකි. එමගින් කුඩා කල සිටම නත්තල් ගසක් පෙන්වා, තෑගි බෝග ලබා දීම හරහා කිතුනු දහම, බුදු දහමට වඩා ආකර්ෂණීය බව කුඩා දරුවෙකුට පෙන්වීමට සලස්වනු ලබයි. එයින් පෙනී යන්නේ අපි කතෝලික ග්‍රහණයට හසුවුන බවයි, දැනටත් හසුවෙමින් පවතින බවයි.

ලාංකික සිංහල ආරයට අනුව සිංහල අවුරුද්ද යනු බොහෝ දුරට පවුලේ උදාවිය එකට එක්ව සමරන තේ පැන් සංග්‍රහයක් වැනි දෙයකි. කිසිම දිනක අවුරුදු කෑම මේසයට කෙහෙල් ගෙඩියක්, කිරිබත් කෑල්ලක් කැවුමක් කොකිසක් හැරෙන්නට අරක්කු බෝතල්, බ්‍රැන්ඩි පැමිණ නැත, පැමිණිය යුතුද නැත. අවුරුදු දින රාත්‍රිය ද නත්තල් රාත්‍රිය ක් කරවීමට යාම දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. නැකැත් චාරිත්‍ර ඉටු කරමින් සැමදෙනා ම එක්ව සිටින අවුරුදු දිනය ද මස්, මාලු, විස්කි බ්‍රැන්ඩි සහිත නත්තල් දිනයක් කර ගත යුතු නැති බව සිංහල බෞද්ධයා මතක තබා ගත යුතුය.

සිංහල අවුරුද්ද සම්පවන විට ලාංකික අපේ සිරිත නම් නගරයේ සිටින උදවිය ගම්බිම් බලා නැවත පිටත් ව යාම යි. නුමුදු ගැටලුව නම් කෙදිනකවත් වෙසක් දිනට ගැමියන් ගමේ නොසිටීම යි. සියල්ලෝම වාහන පුරවාගෙන නගරයට කඩා පනිති. තෙරපි තෙරපී ඇවිද ගොස්, තොරණක් වෙසක් කූඩුවක් දෙස බලා ටවුම් සිරි නරඹා නැවත පිටත්ව යති. කිසිම තොරණක කතාවක් අවසන්වන තුරු කිසිවෙක් රැඳී නොසිටිති. අනෙක් අතට වෙසක් පහන චාම්ව බැලීම මිස මහේශාක්‍ය ලෙස නරඹන ලද්දක් නොවන වග වටහා ගැනීමට කාලය එළඹ ඇත.

වෙසක් යනු සිදුහත් කුමාරෝත්පත්තිය ත්, සිදුහත් තවුසානන්ගේ බුදුවීම මෙන් ම ශ්‍රී ගෞතම බුදුපියාණන්ගේ පිරිනිවන යන ත්‍රිත්ත්වය යි. එවන් දිනයක නටා ගයා සතුටු වන්නේ කෙසේදැයි කියා ප්‍රශ්නාර්ථයක් පවතී. බුද්ධ පරිනිර්වාණය දවසේ තොරණ් ගසා පෘථග්ජන බෞද්ධයෙකුට විනෝද විය හැකිනම් ඒ පිළිබඳව අප නැවත නැවත වරක් සිතිය යුතුය. මේ දිනවල උග්‍රවන ආර්ථික අර්බුදය තත්ත්වය හේතුවෙන් වෙසක් වාණිජකරණ තත්ත්වයේ යම් අඩුවක් දක්නට ලැබේ. එසේනම් තොරණ් අඩු වු පමණින් වෙසක් බිඳවැටේ ද? ඇත්තෙන්ම වෙසක් බිඳවැටී නැත. බිඳී ඇත්තේ ව්‍යාපාරික ප්‍රජාවයි. මේ ආකාරයට වෙසක් උත්සවය වෙනුවෙන් ගමේ සිටින මිනිසුන් කොළඹට පැමිණ නගර සිරි නරඹා තොරණ් බලා වෙසක් සැමරීම කොතරම් ප්‍රඥාගෝචර දැයි සිතා බැලිය යුතුය. බෞද්ධයන් නත්තල පෙන්වීම අරඹන්නේ වෙසක් දින උදේ සිටයි. ඉපදීම වෙනුවෙන් රතිඤ්ඤා දැල්වීම ගැටලුවක් නැතැයි සිතමු. නමුත් බුදු වීමට රතිඤ්ඤා දල්වන්නට හේතුවක් නැත. බුදුරදුන්ගේ පරිනිර්වාණයත් එදින ම නම්, එදා මුළු ලංකාවම සිටිය යුත්තේ අමු නිහඬ තැන්පත් භාවනාවක නොවේදැයි අපි අපගෙන් ම විමසිය යුතු ය.

සැබැවින්ම වෙසක් උත්සවය යනු ජනයා රාශිගත කිරීමක් නොවේ. එම නිසා වෙසක් උත්සවය ගැන යළිත් අලුත් කතිකාවතක් අරඹන්න ට සුදුසු කාලය එළඹ ඇත.

අත්තනායක එම්. හේරත්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය



# බටහිර දාර්ශනිකයන් මුල් බුදුසමය විවරණය කර ඇති ආකාරය

මූලික හෙවත් මුල් බුදු සමය හමු වන්නේ බුදුරදුන් දේශනා කළ ධර්මයේ වඩාත්ම පැරණි වූ ඓතිහාසික ස්වරූපය දක්වන පාලි නිකාය ග්‍රන්ථයන් හි ඇතුළත් සූත්‍රවල යැයි පිළිගනු ලැබේ. මෙම සූත්‍ර ධර්මයන්හි බොහෝ විට දක්නට ලැබෙනුයේ බුදුරදුන්ගේ දේශනා පිළිබඳ සවිස්තර වාර්තාවන්ය. නමුත් එකී දේශනාවන්හි වාර්තා හා දාර්ශනික ප්‍රවණතා පැහැදිලි සෛද්ධාන්තික ස්වරූපයෙන් සෘජු ඉස්මතු කිරීම් වශයෙන් දක්වනු ලබන්නේ නැති බව පෙනෙයි. සාහිත්‍යමය වශයෙන් වුවත් පංච නිකාය (සූත්‍ර පිටකය) ග්‍රන්ථයන් සාමාන්‍යයෙන් මුල් බුදු සමය පිළිබිඹු කරන බව අමතක නොකළ යුතුය. කෙසේවුවත් දැනට අප අතර විද්‍යාමානව පවත්නා ලක්දිව පැරණි ථේරවාදීන් (භික්ෂූන්) විසින් ග්‍රන්ථාරූඪ කොට රැකගන්නා ලදැයි කියනු ලබන පාලි පිටක සාහිත්‍යය වන අතර ත්‍රිවිධාකාර එයින් සූත්‍ර හා විනය පිටකයන් වඩා පැරණි බව සැලකිය යුතුය.

මෙයින් විනය පිටකය වනාහි මුල් බුදු සමයෙහි හමුවන පරමාදර්ශී ශ්‍රාවක සංවිධානය වූ භික්ෂු භික්ෂුණීන්ට අදාළව විටින් විට පනවන ආචාර ධර්මය හෙවත් සීලමය ප්‍රඥප්තීන් හා ඒවායේ නිදාන කතාවන් ද වාර්තා කරයි. පංච නිකාය ග්‍රන්ථ වූ කලී මුල් බුදු සමයේ ඉපැරණි දාර්ශනික ස්වරූපය දැන ගැනීමට උපකාරී වන සූත්‍ර දේශනාවන්ගෙන් යුක්ත වෙයි. නමුත් ඉන් සම්පූර්ණයෙන්ම සියලු සූත්‍ර දේශනාවන් නිසැකවම පිරිසිදු බුද්ධ වචනයම යැයි යන පටු අදහසට යොමු නොවිය යුතුය. මන්ද සාධාරණ හේතූන් හා නිශාචයන් මත පසුකාලීනව යම් යම් කොටස් ඒවාට එකතු වී ඇති නිසාය. උදාහරණයක් ලෙස ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළොවෙන් උදාන පාලිය, සුත්ත නිපාත පාලිය, ථේරගාථා වැනි කොටස් වඩාත් පැරණි යැයි සැලකිය හැකි නමුදු ජාතක පාලිය, නිද්දේස, බුද්ධවංශ වැනි කොටස් අලුතින් සම්පාදනය කොට ඇතැයි සැලකිය හැකිය.

මූලික බෞද්ධ චින්තනය අනුව මිනිසා ඉදිරියේ ඇති ප්‍රමුඛතම ගැටලුව නම් සංසාරගත දුකයි. දුක්ඛ යන පාලි ව්‍යවහාරය හුදෙක් මතුපිට තේරුමක් සඳහා යෙදුනක් නොවේ. මෙය ගැඹුරු අර්ථයකින් මුල් බුදු සමය තුළ ඉදිරිපත් කරන ලද අතර දෘෂ්ටිවාදීන්ගේ ආගම්වලට පහරක් විය. චතුරාර්ය සත්‍යය ධර්මය තුළ මෙකී කරුණු ගැඹුරු ලෙස විස්තර කරන ලදී. මෙහි දී බුදු සමය පුද්ගලයා වඩාත් අර්ථ සම්පන්න හා ප්‍රයෝජනවත් සත්‍ය වෙත යොමු කිරීමට උත්සාහ කරයි. නමුත් බොහෝ දෙනෙක් එකී පදනම මත හිඳිමින් මුල් බුදු සමය සර්ව අශුභවාදී ලෙස සැලකීම පදනම් විරහිතය.

බුද්ධ කාලීන භාරතීය දාර්ශනික පරිසරයෙහි ප්‍රකට වූ බුද්ධි සට්ටනය අර්ථ ශූන්‍ය වූත් නිෂ්ප්‍රයෝජන වූත් අනවශ්‍ය ව්‍යාකූලතා උපදවන්නා වූත් පීඩා ජනක ව්‍යායාමයක නිරත වූ චින්තකයන් අතර ඇතිවූ පිබිදීමක් ලෙස බුදු දහම හඳුනා ගත හැකිය. එහිලා අන්තර්ගත වූ දෘෂ්ඨි ජාලය බ්‍රහ්මජාල සූත්‍රය හරහා විස්තර කොට ඇත.

කෙසේ වුවත් බුදුරදුන්ගේ මූලික අවධානය සෑම විටම යොමුවන ලද්දේ පුද්ගලයා සතර දුකින් එතෙර කිරීමට ප්‍රයෝජනවත් වන කරුණු කාරණා පමණක් මතක තබාගත යුතුය. (චාලුකෙයිය පුත්ත මාණවකයාට මේ පිළිබඳ දීර්ඝ ලෙස කරුණු පැහැදිලි කර ඇත.)

නිශ්චිත පිළිතුරු සැපයීමෙන් තොරව සමකාලීන දාර්ශනික ප්‍රශ්න බුදුරදුන් විසින් බැහැර කරනු ලැබූයේ කවර කරුණු නිසා දැයි නූතන විද්වතුන් විසින් දීර්ඝ වශයෙන් සලකා බලනු ලැබ තිබේ. මෙකී ප්‍රශ්නවලට පිළිතුරු නොදුන් නිසා බුදුරදුන් අඥානවාදියෙකු ලෙස ඒ.බී. කීත් විසින් හඳුන්වා දී ඇත. මන්ද යත් බුදුරදුන් මෙවැනි ප්‍රශ්න ඉවතලන ලද්දේ ඉන් පුද්ගල විමුක්තිය ට කිසිදු සාධාරණ සහනයක් නොලැබෙන නිසාවෙනි.

එසේම රාධා ක්‍රිෂ්ණන් විසින් බුදුරදුන්ව හඳුන්වනු ලබන්නේ ශුභවාදී චින්තකයෙකු වශයෙනි. එසේම ඕගන් නම් දාර්ශනිකයා විසින් උපයෝගිතාවාදියෙකු ලෙස හැඳින්වූ අතර, කුමාරස්වාමි විසින් සම්ප්‍රදායවාදීයකු වශයෙන්ද, ඕල්ඩන්බර්ග් හා පුසැන් විසින් සම්ප්‍රදාය විරෝධී පුද්ගලයකු ලෙස බුදුරජාණන් වහන්සේ නිර්වචනය කරන ලදී. මෙකී විවරණ වලදී බොහෝ විට අමතක කරන ලද කරුණ වූයේ බුදුරදුන් විසින් සමකාලීන දෘෂ්ටි ජාලය අර්ථශූන්‍ය සේ සලකන ලද බවයි. මන්ද එම ප්‍රශ්න සියල්ල අර්ථ සම්පන්න නොවන අවැඩදායි දේවල් යැයි සිතූ නිසාවෙනි. මෙම ප්‍රශ්න අරභයා බුදුරදුන්ගේ නිහැඬියාවට හේතුව මේ පිළිබඳ උන්වහන්සේ කිසිවක් නොදන්නා හෝ, ප්‍රශ්නවලට විසඳුම් නැති හෝ විසඳිය නොහැකි නිසා හෝ නොවෙයි. ඉන් පුද්ගල විමුක්තිය උදෙසා ලැබෙන නිරර්ථක දායකත්වය නිසාවෙනි. මේ පිළිබඳ දාර්ශනික සංවාදය හා සිංසපා වනයෙහිදී කළ පැහැදිලි කිරීම තුළින් පැහැදිලි වෙයි.

"මහණෙනි, (අතට ගත් ඇට්ටේරියා කොළ ස්වල්පයකි.) එලෙසින්ම මවිසින් වෙසසින් නොකියන ලද නම් එය ඉතා වැඩිය. කියන ලදද එය අර්ථ සංහිත නොවේ. බඹසර වසනු පිණිස නොවේ. නිර්වේදය නිර්වාණය පිණිස නොපවතියි."

බ්‍රිතාන්‍ය දාර්ශනිකයකු වූ ඩෙරක් පාෆිට් මහතා විසින් රචිත "Resons and Persons" කෘතියෙහි පුද්ගලවාදය අභියෝගයට ලක් කොට ඇති අතර, බුදුරදුන් විසින් දේශිත සාමයික දර්ශනයේ අනාත්මවාදය සත්‍ය බවට දක්වා ඇත.

බර්ට්‍රන්ඩ් රසල් නැමැති දාර්ශනිකයා විසින් බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාව හා ශීලය පිළිබඳ මධ්‍යස්ථ මතවාදී අදහසක් ඔහු විසින් රචිත "මා ක්‍රිස්තු භක්තිකයෙකු නොවන්නේ මන්ද?" යන කෘතියෙහි දක්වා ඇත. එසේම සෙසු ලෝකයේ ආගම් වලට වඩා සාමයික බුදු දහම තුළ ප්‍රඥාව කේන්ද්‍රීය කර ගන්නා බව තවදුරටත් විස්තර කරමින් දක්වා ඇත.

ෆෙඩ්රික් නෙට්ස් දක්වන පරිදි බුදු දහම වනාහී වෙනස්වීම පිළිබඳ සාකච්ඡා කරනු ලබන අතර එය අදේවවාදී නිර්මාණවාදී දර්ශනයෙන් ඉමහත් වූ දහමක් ලෙස ප්‍රශංසාවට ලක් කරනු ලබයි. කෙසේ වුවත් ඔහු විසින් බුද්ධ දර්ශනයේ නිර්මාණය යනු ජීවිතයේ තවත් එක් පරිච්ඡේදයක් බව ද සංකල්පීය රාමුවක් ඔස්සේ ඉදිරිපත් කරනු ලබයි. (Beyond Good and Evil Article) නමුත් ෆෙඩ්රික් විසින් කරුණු නොදැනීම තුළ බුදු දහම සෑම විටකම ශූන්‍යවාදය හා උච්ඡේදවාදය ප්‍රචාරය කරනු ලබන බව දක්වයි. බුදු දහම කිසිදු දෘෂ්ටියකට හෝ දර්ශනයක් තුළට අන්තගාමීව ඉදිරිපත් නොවන අතර හුදෙක්ම පුද්ගල විමුක්තියම පදනම කරගත් දහමකි. සර්ව අශුභවාදයක් නොවන බවද දත යුතුය. (මන්ද ලෞකික, ලෝකෝත්තර ද්විවිධ අවස්ථා උදෙසා උපදෙස් ලබාදී ඇති නිසාවෙනි.)

එඩ්මන්ඩ් හස්ලර් විසින් දැක්වූ පරිදි බුද්ධ දර්ශනයේ සූත්‍ර පිටකය ඉතාමත් ක්‍රමානුකූලව ඉදිරිපත් කර ඇති අතර එකී දර්ශනය ඔහුගේ මතවාදයට මැනවින් ගැලපෙන බව දක්වා ඇත. ඔහු විසින් රචිත මුද්‍රණ ප්‍රකාශනයක් ලෙස නොදැක්වූ 'Sokrates-Buddha' පර්යේෂණ පත්‍රිකාවේ දී බුද්ධ දර්ශනවාදය බටහිර චින්තන ක්‍රමය හා සසඳමින් කරුණු ඉදිරිපත් කර ඇත ඔහු විසින් සොක්‍රටීස්ගේ යහපත් ජීවිතය හා බුද්ධ දර්ශනයේ සමානකම් ඇති බවද එහි දක්වා ඇත. එසේම භෞතික ලෝකය පිළිබඳ වූ විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම ඔහු විසින් අගය කොට තිබුනද, ඔහුගේ මතය වූයේ නූතන විද්‍යාව මට්ටමට එය සංවර්ධනය වී නොමැති බවයි. නමුත් මුල් බුදු දහම තුළ කරුණු අධ්‍යනය කිරීම තුළ බොහොමයක් කරුණු කරණා දේශනා කොට ඇති බවත් ඒවා නූතන විද්‍යාව අභිබවා යන බවත් හඳුනා ගත හැකිය. නිසි ලෙස කරුණු අධ්‍යනය නොකරන පුද්ගලයෙකුට එය එසේ ගෝචර නොවන බව දත යුතුය.

ලක්ෂ්මී නරසු, හස්‍රාන් ඉනායත් ඛාන්, එච්.ජී. වේල්ස්, මන්මථනාත් ශාස්ත්‍රී ආදී වූ විවිධ දාර්ශනිකයන් බුදු දහමේ සංකල්පයන් හා මතවාද ඉතාමත් ප්‍රායෝගික හා යථාර්ථවාදී වන බවත් පුද්ගල බුද්ධියට ගෝචර වන බවත් ඉතාමත් ප්‍රශංසා මුඛයෙන් කරුණු ඉදිරිපත් කොට ඇත. මුල් බුදු සමය හා බුදු දහම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රථම එහිලා වූ ප්‍රාමාණික කරුණු පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යනයක් කළ යුතුය. එසේ නොමැති නම් ඉදිරිපත් කරන මතවාද හුදෙක්ම අන්තගාමී, නිරවද්‍ය නොවූ ප්‍රකාශ විය හැකිය.

එසේ හෙයින් මුල් බුදු සමය බොහොමත්ම සාවධානව කරුණු මූලාශ්‍ර පදනම් කරගනිමින් නිසිලෙස අධ්‍යනය කළ යුතුය. එසේ නොවුනහොත් වැරදි ආකාරයක චිත්‍රයක් මනස තුළ ප්‍රතිෂ්ඨාපනය වීම වැළැක්වීමට නොහැකි වනු ඇත.

එච්.ජේ.ආර්. බුද්ධික
කථිකාචාර්ය
මූල්‍ය අධ්‍යයන අංශය





# දුර්ලභ මිනිසත් බවේ වැදගත්කම.

එක් කලෙක සර්වඥයන් වහන්සේ තමන් වහන්සෙගේ නිය අග පස් ස්වල්පයක් තබා "මහණෙනි මේ මාගේ නිය අගෙහි වූ පස් බොහෝ වේද, නැතහොත් මහා පෘථිවියෙහි වූ පස් බොහෝ වේදැයි" විචාල සේක. එවිට භික්ෂූහු, "ස්වාමීනි, නිය අගෙහි වූ පස් ඉතා ස්වල්ප වේ. මහා පෘථිවියෙහි වූ පස් ඉතා බොහෝ වේ" යි පිළිතුරු දුන්හ. "මහණෙනි, මනුෂ්‍ය ලෝකයෙහි උපදනා සත්ත්වයෝ නිය අගෙහි වූ පස් මෙන් ඉතා ස්වල්ප වෙත්. අන්‍ය වූ තිරිසන් ආදී අපායන්හි උපදනා සත්ත්වයෝ ඉතා බොහෝ වෙත්ය" යි වදාළ සේක.

මා ඉහතින් සඳහන් කලේ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මිනිසත් බවේ දුර්ලභ බව මැනැවින් පෙන්වා දුන් එක් පාඨයකි. ලොව යමක් දුර්ලභ වන්නට ඒවායේ අගය වැඩි වේ. මැණික් ගල් බොහෝ වටිනා ඛනිජයක් බවට පත්ව ඇත්තේ ඒවා අතිශයින්ම දුර්ලභ වන බැවිනි. කස්තුරි වටිනා ඖෂධයකි. එසේම මිල අධිකය. ඒ එය දුර්ලභ වන හෙයිනි. එලෙසම තිලෝගුරු බුදුපියාණන් වහන්සේ තම සිවුවනක් පිරිසට දුර්ලභ කරුණු සතරක් පෙන්වා දුන් සේක. එම කරුණු වර්තමානයේ අපට කොපමණ වටින්නේද? එසේ වුවද ඉල්ලුම අඩු වන්නට අඩු වන්නට මිල පහළ යාමත් ඉල්ලුම වැඩි වන්නට වැඩි වන්නට මිල ඉහළ යාමත් සිදු වෙතැයි යන ආර්ථික විද්‍යා නියමය පරිදි එම දුර්ලභ දේශනා අද සුලභ බවක් පෙනී යන නිසා ඇගයීම අඩු වී ඇතැයි මාගේ සිතීමයි. තථාගතයන් වහන්සේ දේශනා කළ වදාල එම කරුණු සුලභව පැවතීම නිසා එහි වටිනාකම අඩු වී තිබේද? එසේ නොමැති නම් අන්ධයාට මැණිකේ අගය වටහාගත නොහැකි මෙන් රාගය, ද්වේෂය, මෝහය නම් වූ කෙලෙසුන්ගෙන් මුලාවට පත් වූ ජනතාවට එය වටහාගත නොහැකි ද? යන්න වෙනමම සිතා බැලිය යුතු කරුණක් වේ. තිලෝගුරු බුදුපියාණන් වහන්සේ දුර්ලභ යැයි සඳහන් කළ කරුණු සතර පහත දේශනාපාඨය ඇසුරෙන් වටහා ගැනීමට කටයුතු කරමු.

"දුල්ලභංච මනුස්සත්තං - බුද්ධුප්පාදෝ ච දුල්ලභෝ
දුල්ලභා ඛණ සම්පත්ති - සද්ධම්මෝ පරම දුල්ලභෝ"

"මනුෂ්‍යත්වය ලැබීම දුර්ලභ වන්නේය.
බුද්ධෝත්පාද කාලයක් ලැබීමත් දුර්ලභ වන්නේය.
ඛණ සම්පත්තියක් ලැබීමත් දුර්වල වන්නේය.
සද්ධර්මය අසන්නට ලැබීම අතිශයින්ම දුර්ලභ වන්නේය."

"දුල්ලභංච මනුස්සත්තං" යන දේශනා පාඨයෙන් මිනිසත් බවක ඉපදීම දුර්ලභ කරුණක් වන බව නොව මිනිසත් බවක උපදින්නවුන් තුල මනුෂ්‍යත්වය අතිශයින්ම දුර්ලභ බව ප්‍රකාශ කරයි. මනුෂ්‍යත්වය යන්නෙන් මිනිස්කම පිළිබඳවත් මිනිස් යන වචනයෙන් උසස් මනසක් ඇති බවත් කියවෙයි. නමුත් මිනිස් භාවය ඇතත් උසස් මනසක් ඇති අය කොපමණ ඇත්දැයි තක්සේරු කළ හැකිද? අප සැවොම මනුෂ්‍යත්වය යනු කුමක්දැයි හඳුනාගත යුතුය. උසස් මනසක් ඇති පුද්ගලයන් ලෙස මනුෂ්‍යත්වයේ සාධක හඳුනාගෙන අප ජීවිතයට එය සමීප කර ගත යුතුය. මිනිසා ක්‍රියාකාරී ජීවියෙකු වීමට අත්‍යවශ්‍ය ඉන්ද්‍රියන් අතර මොළය සහ හෘදය වස්තුව ප්‍රධානතම වේ. එම ඉන්ද්‍රියන් දෙක සාපේක්ෂකව ක්‍රියා කිරීමෙන් ජනනය වන ශක්තීන් දෙක වන්නේ ශ්‍රද්ධාව හා ප්‍රඥාවයි. බුදුරජාණන් වහන්සේ දේශනා කල පරිදි මෙම ශ්‍රද්ධාව හා ප්‍රඥාව තුලනාත්මකව සංවර්ධනය කර ගත් විට මනුෂ්‍යත්වය දක්නට ලැබෙයි. එමෙන්ම උන්වහන්සේ අනාවරණය කල විමුක්ති මාර්ගය ශ්‍රද්ධාවෙන් ආරම්භ වී ප්‍රඥාවෙන් නිමාවට පත් කරන ආර්ය මාර්ගයක් වේ. එසේ නම් මෙම ශ්‍රද්ධාව හා ප්‍රඥාව සමතුලිතව ජීවිතයේ ක්‍රියාත්මක කරන්නේ නම් දුර්ලභ යැයි ප්‍රකාශ කල මනුෂ්‍යත්වය ඇත්තෙකු වශයෙන් ඔබ සතුටු විය යුතු නොවේද?

බුදුරජාණන් වහන්සේ දේශනා කල වදාළ දෙවන දුර්ලභ කරුණ නම් බුද්ධෝත්පාද කාලයක් ලැබීමයි. අසංඛ කල්ප ලක්ෂ ගණනකට වරක් බුදුවරයෙකු ලොව පහල වී සුවාසූ දහසක් ශ්‍රී සද්ධර්මය දේශනා කොට සූවිසි අසංඛයක් සත්ත්වයින් සසරින් එතෙර කරයි. සිය දෙඇසින් බුදුරජාණන් වහන්සේ කෙනෙකු නුදුටුවත් ධර්මද්වීපය නමින් විරුදාවලිය ලත් අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ නිර්මල දහම ඇති ලක්දිව වෙසෙන අප කොපමණ වාසනාවන්තයෝ ද? එම දහම තුලින් උන්වහන්සේව දැක ගත හැකි බැවින් අපට එම දුර්ලභ බුද්ධෝත්පාද කාලයද ලැබී ඇතැයි සිතිය හැකිය.

"දුල්ලභා ඛණ සම්පත්ති" නොහොත් ඛණ සම්පත්තියක් ලැබීම ද දුර්ලභ කරුණක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ඛණ සම්පත්තිය ලෙස උන්වහන්සේ වදාළේ කුමක්ද? අතීතයේ සිටම අප අසා ඇත්තේ මිනිසත් බවක් ලැබීම අතිශයින්ම දුර්ලභ බවයි. කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලීම නොවිය හැකි දෙයක් වන්නාක් මෙන් මිනිසත් බවයක් ඉපදීම නොවිය හැකි තරමට දුර්ලභ වන බව පැරැන්නෝ එය හඳුන්වා දුන්හ. එලෙසින් දුර්ලභ වූ මිනිස් බව ලැබූවන් අතර අඳ, ගොළු, බිහිරි, කොර වැනි ශරීර ඇත්තවුන් ද කාස, ස්වාස, පිළිකා වැනි රෝගීන්ද මන්ද බුද්ධිකයින් වැනි පුද්ගලයෝ කොපමණ සිටිත්ද? ඔවුන් ලැබූ මිනිසත් බවෙහි ඇති අගය කුමක්ද? මෙවැනි අවාසනාවන්ත භාවයන්ගෙන් මිදී ඇති පුද්ගලයා දුර්ලභ වූ ඛණ සම්පත්තියක් ලබා සිටින බව තථාගතයන් වහන්සේ ඉහත දේශනා පාඨයෙන් පෙන්වා දුන්හ.

සද්ධර්මය අසන්නට ලැබීම ඉහත සඳහන් කළ කරුණු තුනටම වඩා දුර්ලභ බව "සද්ධම්මෝ පරම දුල්ලභං" යන පාඨයෙන් කියවෙයි. වර්තමානයේදී නම් අපට සද්ධර්මය ඇසීමට කිසිදු දුර්ලභ භාවයක් නැත. පොත පතින් පමණක් නොව සියලු ජන සන්නිවේදන මාධ්‍යයෙන් වුව සද්ධර්මය සුලභව ඇසෙනු ඇත. සුලභතාවය නිසාම එහි අගය අඩු වී ඇත්දැයි යන්න සිතා බැලිය යුතු කරුණකි. බුදුරජාණන් වහන්සේ ඉතා දුර්ලභ යැයි පැවසූ සියලු කරුණු කවර හෝ පිනකින් වර්තමානයේ මිනිසුන්ට ලැබී ඇත. උසස් මනසක් ඇත්තවුන් වශයෙන් ඉතා කෙටි ආයු කාලයක් ඇති අප එම සුළු කාලය තුලදී මනුෂ්‍යත්වය අර්ථවත් කර ගැනීමටත් දහම තුලින් ලැබිය හැකි ඵල ප්‍රයෝජන ලබා සසර කතරින් එතෙර වීමට වෑයම් කල යුතුය. ඉපදීම, ජරාවට පැමිණීම, රෝගී වීම, මරණයට පත්වීම, සෝක කිරීම, විලාප කීම,දුක් වීම, දෝමනස්සය, උපායාසය, ප්‍රිය විප්පයෝගය, අප්‍රිය සම්පයෝගය, යනාදී දුක්ඛයන්ගෙන් පිරි සසර ගමනේ ඉතා දුර්ලභ වූත් ඉතා උතුම් වූත් මනුෂ්‍යත්වය ලැබගත්තවුන් ජීවිතයේ එක් මොහොතකදු නිරර්ථක නොකොට පමා නොවී පින් රැස් කර ගනිත්වා!!!

"කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ
මෙතෙකිනි මෙසසර දුක් දුරලන්නේ
සුදෙනෙහි කිම විරිය නොකරන්නේ"

සියලු දෙනාටම තෙරුවන් සරණායි!!!

සී.එච්.එච්.කේ. සදීශා දිල්සඳු
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# ධම්මානුපස්සනා

ධර්මය යනු, අකාලික වූ, සන්දිට්ඨික වූ, ඕපනයික වූ, සැපය සඳහා මුලාවෙන් සිත මුදවන ධර්මයකි. ධර්මය යනු අවබෝධ කිරීමට නොහැකි තරමට ම ගැඹුරු හා දුෂ්කර එකක් විය හැකියි. එම නිසා, ලෞකික සැපයන්ට ලොල් වූ මිනිසුන් බුදු දහමට ඇල්මක් ඇති කර නොගනු ඇතැයි සිතා, බුද්ධගයාවේ දී සම්මා සම්බුද්ධත්වයට පත්වූ අප මහා බුදුරජාණන් වහන්සේ, ඔවුනට ධර්මය දේශනා කිරීමට මැලි වූ සේක. මේ පිළිබඳව සඳහන් මුල් කාලීන ග්‍රන්ථයන්ට අනුව, විශ්වයේ මැවුම්කරු වූ මහා බ්‍රහ්මයා විසින් අර්හත් ඵලය සාක්ෂාත් කර ගැනීමේ හැකියාව සහිත පුද්ගලයින් සිටින බැවින් සත්ත්වයාගේ සුභසිද්ධියට හේතු කොට ගෙන ධර්මය දේශනා කරන මෙන් බුදුන් වහන්සේ ඉදිරිපිට පෙනී සිට ඉල්ලීමක් කරන ලදී. ඒ ඉල්ලීම අනුව ප්‍රථමයෙන් ම බරණැස ඉසිපතනයේ මිගදායේ දී පස් වග මහණුන්හට උන්වහන්සේ විසින් සිය පළමු දේශනාව ලෙස සමස්ත බෞද්ධ මාර්ගයෙහි රාමුව සකස් කරන්නා වූද, වර්තමානයේ පවා බෞද්ධ සම්ප්‍රදායන්හි පදනම වන චතුරාර්ය සත්‍ය දේශනාව සිදු කළ සේක.

ධර්මය යනු අන් කිසිවක් නොව මේ ලෝකයේ යථාර්ථය, ක්‍රියාකාරිත්වය විස්තර කිරීමකි. මේ යථාර්ථය, ක්‍රියාකාරිත්වය පිළිබඳ දැන ගෙන දුකෙන් මිදෙන මාර්ගය ලෝක සත්ත්වයාට පෙන්වා දීමකි. බුදුන් වහන්සේ ජීවමාන සමයේ සියලු ම ධර්ම දේශනාවන් වාචික ව සිදු කළ සේක. බුදුන් වහන්සේගේ දේශනා සියල්ල දුක මැඬ පැවැත්වීම උදෙසා දේශනා කළ සේක. බුදුන් වහන්සේ විසින් මනුෂ්‍යයන්ගේ තත්ත්වය පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලූ සේක. උන්වහන්සේ මනුෂ්‍ය සත්ත්වයාගේ සුභසිද්ධිය උදෙසා සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළු බව දේශනා කළ සේක. එමෙන් ම උන්වහන්සේ නිරතුරු වෛද්‍යවරයෙකුට උපමා කර ඇති අතර උන්වහන්සේගේ ධර්මය ඖෂධවලට උපමා කර ඇත. ඖෂධ වලින් සියලු රෝග නිවාරණය කර ගැනීමට හැකි වන්නා සේ ධර්මය යන ඔසුව තුළින් අපගේ සියලු ගැටලු නිරාකරණය කර ගැනීමට උපකාර වේ.

අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද බුද්ධ භාෂිතය "ධර්ම රත්නය" ලෙස හැඳින්වේ. බුද්ධ, ධම්ම, සංඝ යනුවෙන් වූ තිසරණයක් පවත්නා අතර, මේ අතුරින් ධර්ම රත්නය සැබෑ සරණය වේ. අප මහා සම්බුදු රජාණන් වහන්සේ විසින් ධර්මය දේශනා කරන අතර, එම ධර්මය අසුරු සැණින් ධර්මාවබෝධ වී රහත් ඵලයට පැමිණීමට හැකි වනුයේ පෙර කරන ලද කුසල අකුසල කර්මයන්ට අනුකූලවයි. එසේම එම ධර්මයට අසුරු සැණකින් අසිරිමත් ලෙස අපගේ දුක මුලිනුපුටා දැමීමේ හැකියාවක් නොමැත. ලෝක සත්ත්වයාට ධර්මාවබෝධය පිණිස සංඝයා වහන්සේට දිරිය හා සහාය ලබා දීමට හැකි වුවද, උන් වහන්සේලාට ධර්මාවබෝධ කර ගෙන සත්‍යයේ මාර්ගයේ ගමන් කරන ලෙස ලෝක සත්ත්වයා හට බල කළ නොහැක. සත්ත්වයා විසින් සැබවින් ම තමන්ගේ සිත, කය, වචනය යන තිදොර සංවර කරගෙන ධර්මයෙහි යෙදීම සිදු කළ යුතුව පවතී. මිනිසා විසින් පෞද්ගලිකව ධර්මය තේරුම් ගෙන ධර්මයෙහි හැසිරිය යුතු වේ. දුකින් මිදීමට ඇති එකම මඟ එයයි. සැබැවින් ම අපගේ ගැලවුම්කරු වන්නේ අපමයි.

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගෙන් සරණ පතා පැමිණෙන කිසිවෙකුටත් හිස් අතින් පිටව යාමට ඉඩ සැලසූයේ නැත. උන්වහන්සේ විසින් ඒ පැමිණෙන තැනැත්තා කවුරුන් වුවද ධර්මය ඔහු විසින් ම අවබෝධ කරගෙන සත්‍ය මාර්ගයට පිවිසීමට ඉඩකඩ සලසා දුන් සේක. බුදුන් වහන්සේ දේශනා කළේ, "මහණෙනි, මේ ඇස අනිත්‍යයි. ඇස අනිත්‍යයි නම් ඇස නිසා සකස් වෙන ඵස්ස, වේදනා, සංස්කාර, විඤ්ඤාණ ධර්මයනුත් අනිත්‍යයි" යන්නයි. 'මෙලොවත්, පරලොවත් ජනයා අතර ධර්මය ශ්‍රේෂ්ඨ වෙයි' යන්න බුද්ධ වචනයයි. එමෙන්ම ධර්ම ස්වාමි වූ අපගේ බුදුන් වහන්සේ පවා ධර්මය ම ගුරු තනතුරේ තබා ගත් බව සත්‍යයකි. ඒ උතුම් ශ්‍රී සද්ධර්මයට සම කළ හැකි තවත් දහමක් මේ ලොව නැත්තේමය. එම නිසා, පිවිතුරු වූ ඒ ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මය කෙරෙහි සිත පහදවාගත් පමණින් වුවද දෙව් මිනිසුන් හට අග්‍ර වූ පින් රැස් වෙයි.

බුදුන් වහන්සේ යනු අපගේ දුක් රෝග නිශ්චයට භාජනය කොට ධර්මය නමැති හොඳම ඔසුව අප වෙත ලබා දෙන කුසලතා පිරිපුන් වෛද්‍යවරයෙකු මෙනි. කෙසේ නමුත් එය ධර්ම පිළිවෙත් පිරීම, ධර්මාවබෝධය හෙවත් ඔසුව ලබා ගැනීම මත රඳා පවතින දෙයකි. එය එසේ සිදු කළ යුතුයි යනුවෙන් අපට කිසිවෙකුටත් බල කළ නොහැකිය. එය සිදු කළ යුතු වන්නේ තමන් විසින්මය. එමෙන්ම ධර්මාවබෝධය පෙර කළ කුසල අකුසල කර්මවලට අනුව ද සිදු වේ. ධර්මය තුළින් අත්වන ප්‍රතිලාභ හා චිත්ත සාමය හා එය අපගේ සියලු ගැටලු, ඉච්ඡා භංගත්වයන් හා දුක් ද මුලිනුපුටා දැමීමට උපකාරී වන ආකාරය දකිනා විට දී අපගේ මෙන් ම අන් අයගේ ද යහපත, ප්‍රයෝජනය පිණිස නිසියාකාරව දහම් පිළිවෙත් පුරමු.

නමෝ බුද්ධාය!

ජේ.එම්. හිරුනි කෞශල්‍යා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# පැලකට පෑයූ වෙසක් සඳ

ශ්‍රී ලංකා මෑණියගේ
දෑසේ උණු කඳුළු ගඟකි..
කඳුළු බලා හිඳිනු බැරිව
දරුවෝ මහ අරගලයකි..
කුලී වැඩත් නැති වූ මගේ
හිත තුළ මහ උසාවියකි..
මයෙ දෝණිත් කළුවරේම
අකුරු කරන අරගලයකි..

වෙසක් සඳක් පෑයූවා
මගෙ දෝණිගෙ පුංචි පැලට..
උදේ ඉදන් දාංගලේ
කූඩු ඉල්ලලාම ඔන්න..
බඩ ගින්දර නිවාලන්න
කෑම ටිකක් දෙන්ට බැරිව..
හිඳිනා මට හැකි වේවිද
මයෙ දෝණිට කූඩු දෙන්ට..

එහා කැලේ තිබුණා හොඳ
මහ විශාල උණ පඳුරක්..
හනි හනිකට ගොහින් මමත්
කපා ගත්තා උණ බටයක්..
කූඩුවේ විලි වසාලන්ට
උදව් වුණා ගොක් අත්තක්..
බැහැ දෙන්නට මයෙ දෝණිගෙ
පුංචි හිතට බර කඳුලක්..

ඩොලර් එකත් ඉහළ ගොසින්
බඩු මිල දැන් අහස උසට..
දල්වන්නට බැහැ දැන් මට
පහන් ගොඩක් වෙසක් කලට..
දල්වන්නම් එක පහනක්
බුදු හිමියනි අප ඔබ හට..
තරහ නොවී භාරගන්න
මයෙ දෝණිගෙ පුංචි සතුට..

ඩෙනීෂා විජේනායක
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය.

# වෙසක් පුන් පොහෝ සඳ

වෙසක් පුන් පොහෝ සඳ
බුදු පුදට සියපත් පිපෙන උතුම් ගෞතම රජ දහන,
ලෝ සතුන් නිවා සැනසෙන අමා මෑණි හිරු නැගෙන,
භවයේ සත දුක නිමා වන,
සසර මඟ නිවී සැනසෙන,
"වෙසක් පුන් පොහෝ සඳ...."
නිහඬ නිසසල මඟක පුංචි ගල්පර උඩින් ලතාවට රටාවට
ගලා බසින මෙලොව,
තුඩින් තුඩ එකතු කර අත් හරින්නට බැරිව,
හද ගැස්ම තුළ තුරුළු කර දුක් කඳුළු වගුරුවන,
ගඟක් සේ ගලා යන මෙබඳු සිතුවිලි අතර,
සමිඳුන් සරණ පතමි...
"වෙසක් පුන් පොහෝ සඳ..."
මහ රෑ කළුවරේ පිපෙන හෙන්ද්‍රික්කා මල් ගොමුවක,
තෙත් වූ දෑසින්... වියැකුණු දෙතොලින් වෙව්ලන දෑඟිලි
අතරින් විමසමි,
"වෙසක් පුන් පොහෝ සඳ..."
පණ නල ගැහෙන එක හුස්මක් වත් කුසගිනි නොදැනෙන,
අතොරක් නොමැතිව පිරී ගිය පන්සල්,
කතරක් නොමැතිව දිස් වූ දන්සැල්,
යෝධයන් මෙන් නැගී සිටි මහා තොරණ,
දෑස් ඇඳ බැඳ ගත් මහා පහන් කූඩු,
සිහිනයකි අද එය......
"වෙසක් පුන් පොහෝ සඳ..."
භවයේ සත දුක නිමා වන සසර මඟ නිවී සැනසෙන,
"වෙසක් පුන් පොහෝ සඳ..."
හිස් වූ සිතත්, විඩාබර වූ ගතත්, වාරු නැති දෙපාත්
අතරින් හිනාවෙන උතුම් ගෞතම රජ දහන,
බුදු පුදට පින්වත් පන්සල් භූමියකට යා ගත නොහී වැලපෙන
මිනිසුන්,
තම පුෂ්පයන් බුදු පා මුල පූජා කර ගත නොහී වැලපෙන
රුක්ෂයන්,
මහා විලාප හඬ අදහා ගත නොහැකි දඟලන සතුන්,
මේ මහා දුක් ගින්දර උහුලාගත නොහැකිව වැලපෙන නිල්
අහස හා නිල් සමුද්‍රය,
මහා දුකක් තුරුළු කර සිත් විලම කළඹමින්.......
" නිහඬව ම නිමා වන ඒ මහා වෙසක් මංගල්‍යය........"
කියූ දේ අතර නොකියූ බොහෝ දේ....
වසන්තය අතර සිර වූ කළු දුමාරය....
"මහා වසංගතය අතරින් නිහඬව නිමා වන"
"වෙසක් මංගල්‍යය"

ඩබ්ලිව්.ඒ.ඩී.ජී. කවිනයා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# වෙසඟේ වරුණ

පස්මහ බැලුම් බලා මෙලොව    ඉපදීම
කල්ප ගණන් පැතු පැතුමකි    බුදුවීම
අහෝ දුකකි හිමි පිරිනිවනට    යාම
වෙසඟම මෙයයි තෙමඟුල නම්    සැමරීම

පන්සාලිස් වසක් ලෝ සත    සැනසීම
ඇදහිය නොහැක බුදු හිමිගේ    කැපවීම
කුල මල හේද බිඳ එක සේ    සැලකීම
අරුමෙකි කෙලෙස හිමි වුණි ඔය ගුණ    මහිම

වෙසඟත් අදත් සමරයි ලෝ සත    සැවොම
පුදුමය කොයි ද බුදු හිමි දෙසූ ඒ    දහම
නිවනට යන්නටය ඒ කල දිරි    වැඩුම
අද කොයිබටද මිනිසුන් තුල ඒ    පැතුම

සුරා සූදුවටමය සිත යොමු    වන්නේ
වෙසඟය කියා නැත දුර්ගති    හැරලන්නේ
අහෝ කෙලෙස නිවනට මඟ    පෑදෙන්නේ
දුදනනි කෙදින දුර්ගුණ ගති    හැරලන්නේ

නිවනට මගයි බුදු හිමි වැඩි මග    යාම
තිරිසන් භවය හිමි කරගනියි දුදන    තෙම
පෙරුමන් පුරා බුදුහිමියන් දෙසුව    දම
රැකගෙන ගියොත් දුර නැත ඒ සසර    ඉම

කෞශල්‍යා ශ්‍යාමිකා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



දිල්කි ඉඳුවරා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# බුදු දහමේ යථාර්ථය සොයා ගිය 'රහත් හිමිවරුන්'

ශ්‍රී ලාංකික බෞද්ධ ප්‍රජාව දෙස වෙනස්ම කෝණයකින් නිර්මාණය වූ "රහත් හිමිවරුන් ගීතය" හෙළ කලා කෙතෙහි එක්තරා සන්දිස්ථානයකි. ෆැන්ටසියක වෙලී සිටින බෞද්ධයන්  යථාර්ථවාදී මගට ගෙන ඒමට ගත් උත්සහයක් ලෙස මෙම ගීතය හැඳින්විය හැකිය.

"රහත් හිමිවරුන්" ගීතයේ ගායන ස්වරූපය අනුව චන්ද්‍රසේන තලංගමයන්ගේ පන්හිදෙන් ලියවුනු ද්‍යාන් හේවගේ විසින් ගායනා කරන කොටසත් රවී ජේ විසින් රචනා කර ගායනා කරන රැප් කොටසත් ලෙස කොටස් දෙකකට වෙන් කල හැකිය. එසේම මෙහි රූපරචනයද ඉතා සුවිශේෂිය.

ඍධිලාභි රහතන් වහන්සේලා අහසින් වැඩම කරති. එම නිසා ම බිම වී පැදුරු පවා වේලාගැනීමට නොහැකි වී තිබේ. එයට හේතුව නම් උඩින් වඩින රහත් හිමිවරුන්ගේ හෙවනැල්ල වී පැදුරුවලට වැටීමයි. වැව් සුළඟට සිල්වත් භික්ෂූන් වහන්සේලා දේශනා කරන සද්ධර්මය බෝපත්වල ලියවී පාවී යයි.

මහා විහාරය යනු ලක්දිව පළමු විහාරයයි. එය සුසිල්වත් ස්වාමීන්වහන්සේලාගෙන් පිරුනු තැනකි. මුළු රටටම ශ්‍රී සද්ධර්මය බෙදාලන ස්ථානයයි. මහා විහාරවාසි සුසිල්වත් හිමිවරුන්ගෙන් ඇසෙන බුදු ගුණ වරුණ කෙතරම් සුමියුරු ද? කහමල් පොකුරු මෙන් උදෑසනම ගෙයින් ගෙට පිඬුසිඟා වඩින උන්වහන්සේලාගේ රුව දැකීම කෙතරම් සුන්දර දසුනක් ද? චන්ද්‍රසේන හලන්ගමයන්ගේ පදපේලි අවසන් වන්නේ මියුරු සේයාරුවක් මනසෙහි අඳිමිනි.

ගීතයේ රූපරචනය ඔස්සේ එහි සමාජ පණිවිඩය තවත් තීව්‍ර කර තිබේ. රූපරචනය ආරම්භවන්නේ මහා සෑය අසල පියාඹන කුරුල්ලන් හයදෙනෙකු ගෙනි. ඒ අතර එක් පක්ශියෙක් අනෙක් පක්ෂීන් ට වඩා විශාලය එසේම පැහැදිලිය. ඔහු එම පක්ෂීන් ගේ නායකයා විය යුතුය. මෙම විශාල පක්ෂියා මගින් අපගේ මනස නිරූපනය කරයි. ඔහු පසුපස ඔහුගේ මඟෙහි ගමන් කරන පක්ෂීන්ගෙන් පංච ඉන්ද්‍රිය නිරූපණය කරයි. ඇස, කන, නාසය, දිව, ශරීරය යන පංචේන්ද්‍රියන් පාලනය කරමින් මනස නම් පක්ෂියා පියාසර කරයි.

ඉන්පසුව රන්වන් ලෙස හොඳට කරල් පැසුණු නිරෝගී කෙත් යායක් නිරූපනය කරයි. මෙමගින් පිරිසුදු නොයිඳුල් ථේරවාදී බෞද්ධ දර්ශනය නිරූපණය වේ. ශ්‍රී මහා බෝධීන් වහන්සේ අසල දෙසන ශ්‍රී සද්ධර්මය සුළඟට මුසුවී දසත විහිදෙයි. කහවන් සිවුරු පොරවාගත් ස්වාමීන් වහන්සේලා රුවන්වැලි සෑය අසල සක්මනෙහි යෙදෙන අයුරු පෙන්නුම් කරයි.

පදපෙළ අවසන් වනවාත් සමඟම රුවන්වැලිසෑය තිබූ තැනම වෙනත් ස්ථූපයක් නිරූපනය කරයි. මෙය තරමක් නවීකරණය වූ නවීන පන්නයේ එකකි. පෙනුමින් තරමක් අභයගිරි දාගැබට සමානය. ශ්‍රී ලංකාවේ බුදු දහම තුළ මිත්‍යාව බලවත් වීම ආරම්භ වූයේ අභයගිරි දාගැබ වෛතුල්‍යවාදීන්ට සඟ සතු කිරීමත් සමගිනි. මෙම ස්ථූපය මගින් මිත්‍යාව පැතිරියාව නිරූපනය කෙරේ. ඉන්පසුව එම ස්ථූපය කැබලිවලට ගැලවෙන ආකාරයත් ඒ තුළ වූ හිස් අවකාශයක් පෙන්නුම් කරයි. මෙමගින් මිත්‍යා විශ්වාසයන්ගේ ඇති හිස්බව නිරූපණය කෙරේ.

ඊළඟ රූපරාමු ඔස්සේ සිදුහත් කුමරුගේ ඉපදීම, සතර පෙර නිමිති දැකීම, බුදු වීම, පිරිනිවන් පෑම ආදී බුද්ධ චරිතයේ සිදුවීම් නිරූපණය කරයි. බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වීමටත් පෙර ධර්ම සංගායනාවක් කිරීමට සිදු වීමට තරම් බුදු දහම පිරිහෙමින් තිබුනි. මෙම නිසාම කෙමින් මනුෂ්‍යයා රාගාදී කෙලෙස්වලට තදින් ඇලුම් කරන්නට විය. බුදුන් වහන්සේ ක්ෂණයක්වත් සැපයැ'යි නොකියූ සසර සැපයැ'යි සිතන්නට විය.
රූපරචනාවෙහි ඇස් වල සිදුවන වෙනස් වීම මගින් මෙය නිරූපණය කර තිබේ.

රාග, ද්වේශ, මෝහාදී ක්ලේශයන් වැඩීමත් සමග මිනිසා මෙලොව සුව සෙවීමට උත්සහ කරයි. "අසුරු ක්ෂණයක්වත් මම සසර වර්ණනා නොකරමි" යන බුදු වදනට පවා පිටුපා යමින් මෙලොව, පරලොව ලෞකික සැපතක් සෙවීමට මනුෂ්‍යයන් පෙළඹේ. ගිහියෝ පංච ලා දී සීලයන්හි නොපිහිටවා පහන්, මල් ආදිය පූජා කරමින් ආමිසයට මුල්තැන දීමට කටයුතු කරති. පන්සල ද, ගිහියන්ගේ ආශාවන් අනුව මෙලොව සැපත ගැන වැඩි වශයෙන් දේශනා කරයි. මෙලොව පරලව සැපත අවසානයේ දි ලබන නිවසක් ගැන දේශනා කරයි. මෙය පන්සල වටා විහිදී යන ආකාරයෙන් රූපසටහනේ දක්වා තිබේ. ඉන් පසුව එළඹෙන රවී ජේ විසින් ගායනා කරනු ලබන රැප් කොටස මුලු ගීතයම මුළුමනින්ම කණපිට හැරවීමට සමත් වේ. එය බෞද්ධ දර්ශනයේ යථාර්ථය වෙනුවට ෆැන්ටසියක ගැලී සිටින බෞද්ධයින්ට එල්ල කරනු ලබන කනේ පහරෙකි.

රූපරචනයට අනුව තපසට සමවැදීමට උත්සාහ කරන තරුණයෙකි. ඔහු සත්‍ය සොයාගැනීමේ මගෙහි ගමන් කරයි. ෆැන්ටසියක වෙළී සිටින බෞද්ධන්ට ඔහු අභියෝග කරයි. සමාජයට ප්‍රතිවිරුද්ධ මතයක් දැරීම නිසාම ඔහුව මිත්‍යා දෘෂ්ඨියෙකු ලෙස හංවඩු ගසයි. එහෙත් ඔහු මිසදෙටුවෙකු නොවේ. ඔහු ෆැන්ටසියෙන් මිදී යථාර්ථය හඹා යන්නෙකි.

මේ අතරම රූප රචනය තවත් මගක් සොයාගෙන යයි. කෙලෙසුන් මැරීමට අනුශාසනා දෙන භික්ෂූන් වහන්සේලා විසින්ම මිනිසුන් මැරීමට ආශිර්වාද කරති. ඊළඟ රූප රාමුවෙන් පියෙක් විසින් සුරතල් කරනු ලබන දරුවෙකු දෙස බලාසිටින සාමණේර වහන්සේ නමක් නිරූපණය කරයි. කුඩාකළ ම ළමුන් මහණ කිරීම සම්බන්ධයෙන් වන සමාජ කතිකාව එමගින් සියුම්ව නිරූපණය කරයි.

"බුදුන් දැක පමණින් නිවන් දකින්න මේ සසරේ - දැක්ක පමණින් යන්නෙ කෙසේද නිවන් සැනකින්"

මෙලොව පරලොව සැපත සොයන බෞද්ධයන්ට එලව එලවා පහර දීමට රචකයා සමත් වී තිබේ. වර්තමාන බෞද්ධයෝ මෙම භවයේදී ම නිවන් දැකීමට අපේක්ෂා නොකරති. ඔවුන් බලාපොරොත්තු වන්නේ මෙලොවදී ත් සැපවිඳ පරලොව දීත් දිව්‍ය සැපවිඳ අවසානයේ දී බුදුන් දැක නිවන් දැකීමට යි. එහෙත් සැබවින්ම බුදුන් දුටු පමණින් නිවන ළගාකරගත හැකිද? බුදුන් දුටුව ද සසරෙහි අතරමන් ඌ කොතෙරම් පිරිසක් සිටින්නට ඇත්ද?

ඊළඟ පදපෙළ දුසිල් මහණුන් ගැන කියවෙන සමාජ විවරණයකි. ශ්‍රාවකයින්ට අත්හැරීම පුහුණු කරන්න යැ'යි කියා භික්ෂූහු සැප රථයෙන් වඩිති. මුදල් පරිභෝජනය කරති. මෙය කොසොල් රජතුමා දුටු එකොළොස්වන සිහිනයට සමානය. බුද්ධ දේශනයට අනුව අනාගතයේ දී සසුන්ගතවන ඇතැම් භික්ෂූන් මුදල්, කම්සැප බලාපොරොත්තුවෙන් උතුම් වූ ධර්මය භාවිතා කරති. ධර්මය විකෘතියට ලක් කරති. උන් වහන්සේ දේශනා කළ එම අනාගතය මේ වන විට උදාවී තිබේ.

"මම ලෙඩ ඇඳේ මරණයෙන් ගලවලා - අම්මෙ අඩන්නෙ ඇයි පිළිමෙට වැඳලා"

කාන්තාවක් විසින් බුදු පිළිමයක් වන්දනා කරයි. ඇය බුදුන් වඳින්නේ තම පුතා මරණයෙන් බේරා දෙන ලෙස ආයාචනා කරමිනි. ඇය මීට පෙර ගැබිණියක්ව සිටියදී බුදුන් වඳින ආකාරය පෙන්නුම් කරයි. සැබවින්ම මැටි පිළිමයකට ආයාචනා ඇහුන්කම් දීමට හැකිද? ආයාචනා ඇහුන්කම් දෙන දෙවියෙක් ලෙස සැලකීමට තරම් බෞද්ධයන් මිත්‍යාවේ වෙලී තිබේ.

"සෙත්පතා මා අතේ බැඳි පිරිත් නූල - දුටුවා මස්කඩේ මුදලාලී ගාව"

බෞද්ධයෝ සෙත්පතා පිරිත් නූල් ගැට ගසති. සතුන් මරණ මස්කඩේ මුදලාලී පවා පිරිත් නූල් ගැටගසයි. මෙහි මස්කඩේ මුදලාලීගෙන් නිරූපණය වනුයේ සොරුන්, මිනීමරුවන් මෙන්ම රට විනාසයට පත් කරන දේශපාලකයින් ය. ඔවුහු සියල්ල දෑතේ කිලිටි මකාගන්නට පිරිත් නූල්, සිවුරු අස්සෙ හැංගෙති.

ඉතාමත් රැඩිකල් පද පෙලකින් ගීතය අවසන් වේ.

"හිතේ කහටක් නැත්තම් - කාටවත් ගිනි දෙන්නෙ නැත්තම් - ඉන්නකම් හොඳින් නම් - ඇයි මං යන්නෙ
පන්සල් ගන්න සිල්- ඇත්ත ඇති සැටියෙන්ම දකින්න සිවුරක් ඕනෙමද?"

සත්‍යාවබෝධය ලැබීමට තපස්දම් පිරූ තරුණයාගේ මණසෙහි නෙලුමක් පුෂ්පිත වනු නිරූපණය කරයි. ඔහු සත්‍ය අවබෝධ කරගත් බව එයින් ප්‍රකාශ වේ.

මේ අතර පන්සලෙහි පිරිත් නූලක් අල්ලන් සිටින දායක දායිකාවන් පිරිසකි. එම නූල පිරිත් නූලකට වඩා යදමක් මෙන් නිරූපණය කෙරේ. මෙමගින් මිත්‍යාවේ වෙළී යදමෙන් බැඳී සිටින ශ්‍රාවකයින් නිරූපණය වේ. පසුව කෙමෙන් එම පිරිත් නූල් ගැලවෙනුයේ යදම් බිඳෙන්නාක් මෙනි. මනුෂ්‍යයන් ෆැන්ටසියෙන් මිදී යථාර්ථවාදී ධර්මයට ඇදී එනු එමගින් නිරූපිත වේ. රූපරචනය ආරම්භ කල පක්ෂීන් නැවතත් පියාසර කරනු දක්නට ලැබේ. මිනිසුන් ද යථාර්තය සොයාගිය තරුණයා මෙන් බවුන් වඩනු රූප පෙළෙහි දැක්වේ. ඔවුන් ද සැබෑ යථාර්තවාදී ධර්මය සොයාගෙන යති.

මෙවන් පිහියෙන් කිරි කන්නාක් මෙන් අසීරු නිර්මාණයක් සිදු කිරීමට පද රචනයෙන් දායක වූ චන්ද්‍රසේන තලංගම මහතාට හා රවී ජේ මහතාටද, ගායනය සිදුකල ද්‍යාන් හේවගේ හා රවී ජේ යන මහත්වරුන්ටද, සංගීතයෙන් දායක වූ චරිත අත්තලගේ ශූරීන්ට ද, සියල්ලට නොදෙවෙනි රූප රචනයක් සිදු කල රැන්ඩි ක්‍රිස් මහතාදට ද අප කෘතවේදී විය යුතුය.

රවිදු ධනංජය
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# දෑත නළලේ තබා වදිනෙම් මගේ සම්බුදු සමිඳුනේ...

සල් මලින් පිරි උයන ලුම්බිණි
සුවඳ දෙයි හැම දස අතේ
බිසව මායා ඉන් වශී වී
ඇවිද යයි ඔබ මොබ වනේ....
පුංචි කුමරකු ලොවට වඩිනා
මොහොත දැන් ලං වුණේ...
දෙව් බඹුන් අහසින් වැඩිය විට
මහී තලයයි ගිගිරුවේ
සත් පියුම් මත තැබූ පා යුග
ලොවට පැතිරෙව් සිහ නදේ
සැමට යහපත සදන අරුතින්
සිදුහත්ය යන නම ලැබමිනේ...
සොළොස් විය පිරූ කුමරු සිදුහත්
ශිල්ප දක්වා සබ මැදේ
කුමරි රූ පිරි යශෝදරාවන්
අග මෙහෙසි විය මන්දිරේ...
වසර විසි නවයක ආයු විය
කුමරු ගෙවමින් ජීවිතේ
පුංචි පුතු රාහුල උපන්නේ
සසර බැම්මක් ඇති වුණේ
සතර පෙර නිමිති දැකුමෙන්
කමරු සිත දැන් සසැලුනේ
එතෙර වන්නට ඝෝර සසරින්
කුමරු අභිනික්මන් කළේ....
නේක දුක් දී සිරුර වැහැරී
තැනින් තැන ඇද වැටෙන්නේ
අත් හරී දුක් දීම සිරුරට
මැදුම් මග වෙත පිවිසුණේ....
ඇසතු බෝ මැඩ වජිරසුන මත
මාර දූවරු පැරදුවේ
වෙසක් සඳ නැගි උතුම් පෝදා
සම්බුදුන් ලොව බැබලුණේ....
උපන් හැම සත් කවරදා හෝ
මිය යෑම නිති දහම වේ
වෙනස් නොම වන කිසිත් නැහැ ලොව
එයයි හිමි දෙසූ දම් පදේ
නිරෝගී බව උතුම් සැපතයි
ලොවේ සැම වෙත වදහළේ
ලෙඩින් පෙළි සත් කලොත් සුවපත්
හිමිට උවටැන් කළ මෙනේ....
සුරැකි නිති පන්සිල්ද පිලිවෙත්
පොහොය අටසිල් රකිමිණේ
සැමට මෙත් කරුණා ගුණ
පතුරමින් හද නිවමිනේ...
රාග ගිණි දලු ද්වේශ ගිණි දලු
මෝහයෙන් නොම මුලා වේ
සමිඳු බණ පද මගේ සවණත
රැඳේවා මතු මතු දිනේ!

සිව්වනක් මහ සඟන පිරිවර
සමග හිමි වැඩි මාවතේ
දිලුන රන් රුව බුදුන් සිරිපද
මගේ නෙත් අග මැවෙන්නේ
සිරිලකම බියපත් ලෙඩෙන් හෙම්බත්
යදී පණ නළ හඬමිනේ
සමිඳු ගිය මග දෙසූ බණ පද
පසක් විය දැන් දැන් හදේ
ලබන්නට සැනසුමද නිවනද
අවැසි බව සිහි ගනිමිනේ
දෑත නළලේ තබා වදිනෙමි
මගේ සම්බුදු සමිඳුනේ....

ආර්.එම්.පී.යූ.බී. රත්නායක
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සැදැහැම් ආසිරි

සඳ එළියෙන් නැහැවුණු බෝපත් සිසිලේ
වෙනදා නොමැති සන්සුන් හදවත් ඇත්තේ
සාධුකාර දී හැමදෙන වැලි මළුවේ
වෙසගේ සිරිය මැවුනා හැම හද මඬලේ

සිදුහත් කුමරුගේ උපතය සිහිවන්නේ
මහ බෝසතුන් සම්බුදු බව ලැබගන්නේ
ගෞතම මුණි රජුන් පිරිණිවනට යන්නේ
වෙසක් දිනේ තෙමඟුල සිහ කරලන්නේ

සුවඳැති රුවැති මල් මිටි නිති පුදදෙන්නේ
දසත ම නෙක ආසිරි පහනින් බැබළෙන්නේ
අනියත දහම ඇත්තයි ලොව පවසන්නේ
හිමි දෙසු දහම් පද වෙසගේ සිහිවන්නේ

සම්බුදු තිලෝ හිමි නමදින හැම වාරේ
පැතුවා එකම පැතුමක් මුළු හදවතිනේ
සංකා සෝක දුරු වී හැම හදමඬලේ
සාධු සාධු අපි නිවනින් සැනසෙන්නේ

චතුරි සමරතුංග
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# ගිලිහී යන වෙසඟ අසිරි

වෙසක් සඳ මෝදුවන
පින් බර වෙසක් දිනයට
සුදු පිරු: වට පැළඳ
කල කී දුසල් සිහි කර
බණ මඬුව අභියස
දස සිල් සමාදන් වන
පින්බර මව් පිය දු දරු: කැල
අද කොහිද සැඟව ඇත
උපයනා සොච්චමෙන්
හැකි පමණ දන් දෙමින්
සතහට ම මෙත් වඩන්
සියලු දෙන එක්ව සාමෙන්
සැමරු: වෙසඟ අසිරි සිරි
අප අතර නොමැත අද
සියලු දේ අනියත බව
පසක් කළ මෙපින් දිනයට
බුදු දහම කෙලෙසන
සැණකෙළි කුමට මෙපමණ
මත් වතුර තොලගාන
දනන් සතුටින්  උදම්වන
අතරතුර තවත් බොහො දෙන
යදිති මහ මඟ සිඟමන
මෙලෙස සමරා තෙමඟුල
වේවිද සෙතක් සතහට
එදා පරපුර සතු යහගුණ
පිරිහෙන්නට නොදී රැකගෙන
හෙට බිහිවන අපෙ පරපුරට
තිළිණ කරනට සිත්දරාගෙන
පින්බර වෙසඟ සමරමු
සියලු සතහට මෙත් පතාගෙන

එරන්දතී හර්ශනී
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# මෝහය හේතුහාමිගේ දැක්මෙන්

"මා හිතවත් පින්වතුනි" හේතුහාමි තිගැස්සී අවදි විය. නිවසින් පිටතට නික්මුණේය. ශබ්දවාහිනී කණුවෙන් කණුවට හේතුහාමි දුටුවේය. ගම පුරා එකම හඬක් රැව් පිළිරැව් දෙන්නේය. ඒ පන්සලේ හාමුදුරුවෝ ය. "වෙසක් පෝදා පන්සලේ ධාතු ප්‍රදර්ශනයක්, පහන් දහසක පූජාවක්, නෙලුම් මල් දහසක පූජාවක්, සැදැහැ සිතින් ඔබත් එක්වන්න." හඬ මැකී ගියේ ය. ගමේ සුපුරුදු නිස්කලංක බව යළිත් හිස එසවීය. නිමේෂයකි. යකඩ කටේ ගෝරනාඩුව නැවතත්. බොදු ගී රාවයෙන් ගමම ගිගුම් දෙන්නට විය.

හේතුහාමි නිවස තුළට ගියේ ය. ගෙතුළ එකම කාලගෝට්ටියක් විය. යකඩ කටේ හඬ පැරදවීමට උනුන් පරයා උනුන් හඬ නගති. හේතුහාමිගේ සිතට නොසන්සුන් බවක් දැනුණි. සුදු වතින් පේ වුණි. පන්සල් වත්තට පා නගන්නට වුණි. ගමේ සෙස්සන් ද රේඩියෝ වලින් තරඟෙට බණ අසති. නමුත් කිසිවෙක් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වති. අයෙක් තම වත්තට ආ සුනඛයන් ගල් ගසා එලවති. තවකෙක් අනෙකෙකුගේ නිවසේ එළදාව සොරෙන් නෙලති. කිසිවෙකුගේ සිතේ බණ පදයක් පැලපදියම් වී නැත. දැන් බොදු ගීත් බණ ත් එකට මුසු වී ඇසේ. "රැල්ලට ගිය ගම" හේතුහාමි තමාටම කියා ගත්තේය. යන අතරමඟ පූජකයෙක් විය. අන්‍යාගමික දේශනාව කිග එය අසන්නන්ට පමණක් ශබ්දය සීමා විය.

පන්සල් භූමියට ඇතුල්වෙත් ම හේතුහාමි කල්පනාවක ගිලෙන්නට විය. වෙනදා සිහින් පවනට ළෙලදෙන බෝපත් නාදය අද සවනට නොවැකුනේ ය. දායක සභිකයන් අතර මයික්‍රෝෆෝනයට සීතල යුද්ධයක් විය.

ධාතු නරඹන්නන් අතර ද තරඟයක් විය. හේතුහාමි මැදහත් සිතින් පෝලිමට විය. ඔහුගේ නෙත් යොමු උනේ බෝධීන් වහන්සේට ය. බුදුරදුන් සියක් දේ අත්හල තැන, ඇතමෙක් දහසක් දේ ඉල්ලා වැඳ වැටෙති. ඒ අසලම පහන් දසදහසක පූජාවක් විය. දැල්ල මිය යන්නට මත්තෙන්, අනිත්‍යතාව මෙනෙහි කරනවා විනා තෙල් දමා සමහරෙක් නැවත නැවතත් පහන ජීවත් කරවයි.

අවට හරි හැටි කුසට අහරක් නැති, තෙල් පොදක් නැති දුගී පවුල් රැසක් ඇත. මසක් පාසා හේතුහාමි අප්‍රසිද්ධියේ දෙන ආහාර මල්ලෙන් ඒ බැව් ඔහු හොඳටම දන්නේය. ඒ අතරම නෙලුම් මල් දසදහසක පූජාවක් විය. "බඹරුන්ට, දෙබරුන්ට කොයින් ද රොන්? උන් නැතිව සිදු වෙයිද පරාගනයක්. මල පිපී තිබියදී ම නොහැකි ද පතන්නට මේ මල බුදුනට පූජා වේවා! යි. සොබාදහමට අත තැබීමට කොයින් ද මිනිසාට අයිතියක්" හේතුහාමි ගැඹුරු කල්පනාවකට වැටුනි. "පූජේමි බුද්ධං කුසුමේන නේන" ඈත සිට හේතුහාමි මෙනෙහි කරන්නට විය. මේ මල් පරවෙනවා සේම, මම ද මිය යමි යි හේතුහාමිට සිහිවිය.

ඉර මුදුන් වූ අතර ශරීරය දහදියෙන් තෙත් විය. පෝලිමේ සියල්ලන් පසුකර ගියේ නම ගිය ප්‍රභූවරයෙක් ය. ඒතුමා හට පෝලිම් අදාල නොවී ය. හේතුහාමිත් යාන්තම් මන්දිරයට ඇතුල් විය. අසලටම යාමට හැකි වූයේ ප්‍රභූවරයාට පමණි. හේතුහාමිට යන්තම් දැකගන්නට වාසනාවක් තිබුණි. අතීතයේ බුදුහිමි හමුවට යන්නට කුලය අදාල නොවුනු බැව් හේතුහාමිට සිහිවිය. එය ද මැදිහත් සිතින් ඔහු පිලිගත් අතර අනිත්‍යතාව මෙනෙහි කරන්නට විය.

එච්. ඩී. එච්. සෙනුරි දුනුකේ
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සමරමු බැති සිතින් මහ පුන් පෝ දවස..

මහ පින් පුත් කුමරෙක් බිහි වූ දවස
බෝධිසත්වයන් බුදු බව ලැබූ දවස
පිරිනිවනින් සකලම කම්පිත වූ දවස
සමරමු බැති සිතින් මහපුන් පෝ දවස

බුදු බණ අසන සැම සිත් සුවපත් වේවා
දින දින තැවුණු සිත් හට සහනය වේවා
මෙත් ගුණ බලෙන් දුක් පීඩා දුරු වේවා
තෙරුවන් අසිරිමත් සිරි වෙසඟක් වේවා

තෙල් මල් සුවඳ දුම් ගෙන පන්සල් යන්න
පස් පවෙන් මිදී දහමින් සිත් පුර වන්න
කළ පින් මතක් කරමින් සිත් සන සන්න
නිවන් මඟට නෙත් යොමු කර ලන්න

කේ.ඒ.ඩී. මදුශානි
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය





පී.ඩී. ඉරේෂා බර්නදෙත්
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# තෙමඟුල

පස් කල් බලා සත හට කරුණා පෙම්මා
රජ දෙව් කුස ගත් කිරි ගපිඳුන් මා
ලුම්බිනියෙ සල් සුවඳින් ඉතිරෙන් මා
පින්වත් කුමරු ලොව වෙසගේ පහළවුණා

නෙක සැප විඳගත් සිරි සක්විති රජුනේ
පියරජ තොමෝ සතුටින රජ සැප දුන් නිතිනේ
සසර වසන සිය සහකාරිය සමඟින් තුටිනේ
සිදුහත් කුමරු නෙක සැප සම්පත් ලදිනේ

කම්සැප කලකිරී කුමරු සාර නිමිත්තක් ලදිනේ
සසර දුකකි ලොව් සත කමේ ඇලිලා දුක් විඳිනේ
නෙක සැප හැර පියා උතුමන් තපසට යන්නේ
සය වස් සොයා දම් වෙසගේ ලොව්තුරු බුදුවන්නේ

ලොව්තුරු බුදුරද දම් සතහට නෙක පෙම්මා
සතහට නිවන තෙර යන මඟ විවරෙන් මා
බැස යන වෙසක් සඳ කුසිනා නුවරින් මා
තුන් ලොව එළිය කළ මුනිඳුන් බැස යන්මා

දේශානි දිසානායක
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# කතකගේ සෝදුක

සොඳුරු දවසක් මුණ ගැසෙන්නට
වරම් නැති මේ ලෝකයක්
වියළි කතරක ගෙවන දිවියක
කිනම් සතුටක් කොයිද යත්
වියළි කතරක දිය සොයාලා
ඇදෙන කතකගෙ සෝදුකක්
කෙසේනම්දෝ කියාපන්නේ
අහෝ දෙවිඳුනි සෝදුකක්
අනේ දෙවිඳුනි
වියළි කතරට
දෙන්න එක වැහි දිය පොදක්

නුවිනි මධුෂිකා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සිතුවිල්ලක නිවන

ගතට සිසිලස හමා ආ තැන
හිතට නිවනකි දැනුණේ මා හට
මුවගේ පිරි සිනහව දකින්නට
පැමිණියේ ඔබ රුව දකින්නට...

දහස් දෙන ගිනි දවාලූ බිම
නිවුනේ සැනකින් වදනකින් එක
සංහරේ පැතුමයි නිදන්නට
නො එන ගමනක ඇරඹුමයි එය...

ශාන්තව සැම සිටින බිමකි
සියලු දෙන පෙම්බඳින තැනකි
එහෙයි කියන ට තැනක් නොවෙති
බුදුනේ ඒ ඔබේ සෙවනෙ පමණි...

එන්.පී. ඉෂාරා සෙව්වන්දි
තෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# MOD වූ වෙසක්

නිශා කල ගුවන් තලයේ උදා වන සුපුන් සඳ ඝන අඳුර දුරු කර මුළු මිහිතලයම ඒකාලෝක කරයි. දිවා කල ගුවන් තලයේ උදා වන හිරු දෙව්ිඳු සියලු ප්‍රාණයන් ප්‍රබෝධමත් කරයි. ලෝකය නැමති වෘක්ෂයේ අපමණ කාලයකට වරක් හට ගන්නා දයා, කරුණා මකරන්දයෙන් හා ප්‍රඥා සුගන්ධයෙන් අනූන මල් කැන අප මහා බුදුරජාණන් වහන්සේ ය.

බක් මාසයේ නිමාවත් සමග වයස් භේදයකින් තොරව අප මුවින් පිටවන පියකරු වචනය 'වෙසක්' ය. මෙම 'වෙසක්' යන්නෙහි නියම අරුථ කුමක් ද? සිංහල භාෂාවේ අමුතු වේෂයකටත් වෙසක් යැයි පවසයි. නමුත් අප මෙහිදී වෙසක් යනුවෙන් හඳුන්වන්නේ එම වෙනස නොව, අප මහා බුදුරජාණන් වහන්සේගේ ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම යන තෙමඟුල සිදු වූ පොහෝ දිනයයි. පාලි භාෂාවෙන් 'වේශාඛ' ලෙසත් සංස්කෘත භාෂාවෙන් 'වෛශාඛ' ලෙසත් හඳුන්වන්නේ මෙම උතුම් වෙසඟයි.

"අනිත්‍යතාව" යනු වෙසක් මගින් පිළිබිඹු වන ප්‍රධාන සංකල්පයකි. අප මහා බෝසතාණන් වහන්සේ සියලු සැප සම්පත් සහිත ස්ථානයක ඉපිද සත්‍ය අවබෝධ කර පිරිනිවන් පෑ සේක. වෙසක් පොහෝ දිනට ගමේ මල් ගස් වල මල් ඉතිරි නොවන තරම් ය. එසේ බුදු පුදට යන මල් පැය කිහිපයකින් මැලවී පරව යන්නේ ය. සමචතුරස්‍ර කොටු සතරෙන් චතුරාර්ය සත්‍යත්, ත්‍රිකෝණ පැති අටෙන් අට ලෝ දහමත්, අටපට්ටම් කූඩුව වටා එල්ලා හැලෙන රැලි සමූහයෙන් නිමක් නොවන සසර ගමනත්, උඩු සහ යටි පැත්තේ ඇති හිස් කොටු දෙකෙන් ඉපදීම හා මරණයත් පිළිබිඹු වන විවිධ විසිතුරු සැරසිලි දාමින් අලවා නිම කරන ලද අටපට්ටම් පහන් කූඩුව වර්ෂාවට හසු වී, අව්වට වේලී හෝ ගිනිබත් වී යාමෙන් අපට පෙන්වා දෙන්නේ සියලු දේ හි ඇති අනිත්‍යභාවය නොවේ ද? ජී.බී. සේනානායකයන්ගේ 'වෙසක් පහන' කෙටිකතාවේ ද මෙවැනි සිදුවීමක් අන්තර්ගත වේ. කවුරු කුමන සැප වින්ද ද අවසානයේ සියලු දේ අනිත්‍ය වේ.

ආගම ධර්මයෙන් ඈත් වී ආශාවන් පසුපස වේගයෙන් හඹා යන සාරධර්ම සෝදාපාලුවට ලක් වූ වත්මන් සමාජය තුළ දක්නට ලැබෙන වෙසඟේ ප්‍රායෝගික සත්‍ය කුමක් ද? 'බෞද්ධ' යන පදයෙහි අරුථ 'අවබෝධයට පත් වුණු' යන්න වුව ද අද සමාජයේ බොහෝ දෙනෙක් උප්පැන්න සහතිකයේ 'බෞද්ධ' ලෙස සඳහන් වූ නිසාවෙන් පමණක් බෞද්ධයන් වූවන් ය. කැමරාවක් සමග කට්ටිය සෙට් වී වෙසක් බලන්නට ගොස්, අනිත්‍ය වටහා ගැනීමට සකස් කෙරූ පහන් කූඩු ඉදිරියේ සිට තමන්ගේ ඡායාරූප ගනිමින් විනෝද වී, ගෙදර කන්න තිබිය දී දන්සල් වැඳීමට ගොස් පෝලිම් පැන දන්සල් කා (Vesak Vibes) යනුවෙන් මුහුණු පොතේ ඡායාරූප පළ කිරීම වත්මන් සමාජයේ තරුණකම ලෙස පවසයි. උදා පින්නේ පිපෙන කුසුමක කලලය වූයේ පෙරදින මලින වූ මලකි. ඒ අයුරින් අනාගත සමාජයේ ශක්තිය වනුයේ තරුණ පරපුරයි. නමුත් ඔවුන්ගෙන් බොහෝ පුද්ගලයින් හට බෞද්ධකම කියා ඇසුණු සැණින් සිතේ ඇතිවන්නේ වෙසක් කූඩු, තොරණ, දන්සල් ආදිය පිළිබඳව ඇති වන්නා වූ විනෝදාස්වාදාත්මක හැඟීමයි. තොරණ නැරඹීමට ගොස් තොරණේ කතා වස්තුව ඇසෙන අතරවාරයේ තොරණ නැරඹීමට පැමිණි වස්තුලා වෙත දුරකතන අංක ලබා දීම්, ඔවුන්ගේ රූ සපුව විඳ ඉන්ද්‍රිය පිනවා ගැනීම් සුලබ සමාජයේ තොරණ අවසානයේ එය පිටුපසටම වී සුරාමතින් මත් වන පුද්ගලයින්, හේත්තු වීමට බිත්තියක් සොයා ගැනීමේ අරමුණින් පාන්දරින්ම සිල් ගැනීම සඳහා ගෙදරින් පිටවන වැඩිහිටි ඇත්තන් ද දුලබ නොවන්නේ ය. එක් දිනක් ගිහි ජීවිතයෙන් නික්මී වෙනත් ස්වභාව පරිසරයකට ගොස් නොදන්නා දහම් කරුණු අවබෝධ කරගන්නවා වෙනුවට කණුවකට හාන්සි වී යහමින් නිදාගෙන 'බුදුහාමුදුරුවෝ' යැයි ඇසුණු සැණින් මහා ශබ්දයෙන් සාදුකාර දෙන උපාසක උපාසිකාවන් අතර එසේ නොවන උපාසක උපාසිකාවන් ද නැතුවා නොවේ. අවුරුද්දේ එක දවසක් විතරක් නාලා අනිත් දවස් ටිකේ මඩේ ඉන්නවා වගේ සමහරුන් හට තමා බෞද්ධයෙක් බව මතක් වන්නේ ද පොහොයක් ළං වූ විට පමණි. අතීතයේ ගැමි නිවෙස් වල සියලු සාමාජිකයෝ වෙසක් පෝයට පන්සල් ගියෝ ය. ඒ යන්නේ ගමේ පන්සලට හෝ වෙනත් ගමක පන්සලකට විය හැක. එසේ යන ගමනේ දුෂ්කරතා ඇති වන්නේ වර්තමානයේ මෙන් පාරවල් ඉදි නොවී තිබීම සහ කැලෑ එළිපෙහෙළි කර නොතිබීම නිසාවෙනි. ගමේ කොල්ලෝ කුරුට්ටෝ එකතු වී තැනින් තැන දන්සල් ලබා දුන්නේ මෙම පුද්ගලයින්ගේ විඩා නිවීම පිණිස ය. ඒ ලබා දුන්නේ ද ඉරමුසු, බෙලිමල් ආදී දෑ ය. දන්සලක් කියා සිතා වැරදී හෝටලයකින් කෑම කෑ ගැමියාගේ හා ගමහාමිනේගේ විරිඳුවක් පිළිබඳව අසා ඇත්තෙමි. වර්තමානයේ දී සිදුවන්නේ ද එසේ මුදල් ලබා දී හෝටලයකින් කෑවා වැනි සිදුවීමකි. හුළු අතු රැගෙන වන්දනාවේ යන පිරිසට ආලෝකයක් ඇති කරනු වස් මග දෙපස කෙසෙල් බඩ වල ආලෝක දැල්වී ය. එසේ ආරම්භ වූ එළි අද වන විට සව් කොළ වලින් ආවරණය වූ පහන් කූඩු දක්වා දියුණු වී ඇත.

දුටු ගැමුණු රජතුමාට පෙර බුද්ධ ඉතිහාසයේ 'වෙසක්' උත්සවයක් ලෙස නොපැවැත්වී ය. නමුත් වර්තමානය වන විට 'වෙසක්' යනු උත්සවයකි. උත්සව යන්නෙන් අප හඳුන්වන්නේ සමරන දෙයක් මිස පින් දහම් රැස් කරන දෙයක් නොවේ ය. බුදුරජාණන් වහන්සේ යනු නිශ්ශබ්දතාවය අතිශයින්ම අගය කළ උත්තරීතර ශාස්තෘවරයෙකි. බුදුන්ගේ අග්‍ර උපස්ථායක ලෙස කටයුතු කළ ආනන්ද තෙරණුවන් ද එසේ ය. තව ද අප මහා බුදුරජාණන් වහන්සේ තරම් පරිසර හිතකාමී ලෙස කටයුතු කළ තවත් ශාස්තෘවරයෙක් නොමැති තරම් ය. එසේ නිශ්ශබ්දතාවය අගය කළ පරිසරයට ඇලුම් කළ ශාස්තෘවරයෙකු සිහිපත් කිරීමට කෙතරම් ඝෝෂාවක් අප සිදු කරනවා ද? තොරණ ආසන්නයට ගිය විට මහා ශබ්දයෙන් බොදු බැති ගී දමා ඇති අතරම, ඊට වඩා ශබ්දයෙන් ආධාර කළ වුන්ගේ නම් කියවීම සිදු කරයි. නලා හඬින් වාහන වල හෝර්න් හඬින් ශබ්දය දූෂණය කරමින් බීම බී ඉවත් කරන බෝතල්, කෝප්ප, ආහාර දැවටූ කොළ බිම දමා පරිසරය දූෂණය කරමින් බුදුන් වහන්සේගේ තෙමඟුල සැමරීම කළ යුතු ද?

සියලු දේ මුදලට යට වූ සමාජයක 'වෙසක්' වාණිජකරණය නොවී ඇතැයි පැවසීමට අපහසු ය. වර්තමාන සමාජය මොඩ් වී ඇත. බොහෝ පිරිස් වැල යන අතට මැස්ස ගසති. සිරිපා කරුණාව ද ෆන් එකට යන ට්‍රිප් එකක් වූ සමාජයක වෙසක් මොඩ් වී නැතැයි කිව හැකි ද? වෙසක් කියා අප කරන්නේ කුමක් ද? නිවසේදී ම පහන් කූඩු සාදනවා හෝ ආනයනික කූඩු මිල දී ගෙන, බල්බ් වැල්, බකට් එල්ලා, ඉටිපන්දම් දල්වා පින්තූර ගසා සමාජ ජාලා වල පළ කිරීම සිදු කරයි. වර්තමානයේ දී සමහර පුද්ගලයින් හට වෙසක් යනු තම ගෙවල් දොරවල්, වාහන පෙන්වීමට ඇති කදිම අවස්ථාවකි. සමහරුන් කිරීමට දෙයක් නැති කොට 'සුභ වෙසඟක් වේවා' කියා පෝස්ටු සාදා සමාජ මාධ්‍ය ඔස්සේ ටැග්, ශෙයාර් කිරීම් සිදු කරයි. උපන් දිනයකට හෝ නව වසරක් ආරම්භයේ දී 'සුභ උපන් දිනයක්', 'සුභ නව වසරක්' කියා සුභ පැතීම අනුමත කිරීමට පුළුවන. මන්ද යත් සියලු දේ අට ලෝ දහමට යටත් ලෝකයේ ඔවුන්ගේ උපන් දිනය හෝ නව වසර හොඳ හෝ නරක එකක් විය හැකි නිසාවෙනි. නමුත් බුදු තෙමඟුල සිහි කරන වෙසක් සුභ හෝ අසුභ විය හැකි ද? ඉපදීමම දුකක් වන ලෝකයේ බුදුරජාණන් වහන්සේ ද මනුෂ්‍යයෙකි. උන්වහන්සේගේ ඉපදීම උත්සවයක් ලෙස සතුටින් සමරන්නේ කෙසේ ද? විය යුත්තේ එය ද? බල්බ් වැල් දමා, තොරණ පත්තු කර අප බැබලෙන්නට දඟලනවා මිස අසරණ වූ මිනිසෙක් බබලවන්නට අප උත්සාහ කළේ ද? ඒ වෙනුවෙන් මෙතෙක් කාලයක් අප සිදු කළේ මොනවා ද? වර්තමානය වන විට කොරෝනා වසංගතය හේතුවෙන් වෙසක් නැති වූවා යැයි සමහරු කියති. "නැති වූයේ වෙසක් නොව මාධ්‍ය මගින් ඇති කරපු වෙසක් වෙළෙඳපොළ" මෙය මා අසා ඇති ප්‍රකාශයකි. එය සත්‍යයක් බව ද මම විශ්වාස කරමි. පොල් කෙන්ද කෙන්ද එක් වී සෑදෙන ශක්තිමත් කඹය අලියෙකුට වුව ද කැඩිය නොහැකි සේ මේ වසංගත සමයේ සහයෝගයෙන් එක්ව අසරණ වූ පුද්ගලයින්ට, සත්ත්වයින්ට අපට උදව් කළ නොහැකි ද?

අද අද එයි මරු පින් කර ගන් නේ
කෙලෙස ද හෙට මරු නේති සිතන් නේ
කි කල ද මහසෙන් මරු ඇප වන් නේ
කුමට ද කුසලට කම්මැලි වන් නේ

මොඩ් වූ වෙසඟක් සමරන මෙම සමාජය තුළ සැබෑ වෙසඟ එය බව මම තදින් විශ්වාස කරමි.

ඩෙනීෂා විජේනායක
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# වඩිනු මැන,
# අප ගැන සිතා මොහොතක්...

සීත නිසසල පුර හඳක්
නිමා කළ කාල අමාවකක්
ලෙල දුන්නත් සිලි සිලි බෝ පවන්
දුරයි අදනම් බෝ මලුව හුගක්

සුදුවතින් පෙහෙවස් වෙමින්
සුවඳ රන් මල් දම් ගොතන්
පුදනු වස් ආමිස ප්‍රතිපත්තියෙන්
හිමියනි අදනම් නෑ ඉඩක්...

පාට කඩදහි පොදි බැඳන්
සිත්තම් කරන්නට සම්මා වායාමයන්
ලෙල දුන් දජ මෙන් තෝරන්
නෑ ලොව ම අද ගිනිගත් විශාලාවක්...

ලොව සනාතන හේලි දහමක්
ඇසෙන නෑසෙන අමාදම් ගඟුලක්
නිමාකරන්නට සංසාර චාරිකාවක්
නිදුකාණෙනි....
වඩිනු මැන අප ගැන සිතා මොහොතක්...

ඒ.ඩබ්. සෙව්වන්දි
තෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# අනිත්‍යය

"අවසරයි අපේ හාමුදුරුවනේ"

"අහ්... මුදලාලි මහත්තයා... මොකද පන්සල පැත්ත මතක්වෙලා..."

"අනේ හාමුදුරුවන්ට කියන්න... බිස්නස් වැඩවලට හිරවුනාම කෑම බීම උනත් අමතකයි නොවැ"

"ඒ තරමට වැඩනේද? ජීවිතේම සල්ලි නොවේ මුදලාලි මහත්තයෝ.. අපි යන තැනකට පිනක් දහමක් කරගෙන යන්නත් ඕනෑ"

"එහෙමයි හාමුදුරුවනේ! මම මේ පන්සලට ආවෙත් තකහනියක් මේ පාර වෙසක් උත්සවේ මගේ තනි වියදමින් කරන්න කැමති කියලා ඔබවහන්සේට දන්වන්න"

"ඒ කාරුණාව නම් බොහෝම අගෙයි.. වෙන්න ඕන වැඩ ටිකත් දැන්මම දැනුවත් කරන්නම්කෝ මං.... යමු ආවාසේ ගේ පැත්තට.."

...............

හාමුදුරුවොන්ගේ අවසරේ ගත්තා. දැන් තියෙන්නේ කඩේ නම ගහලා කොඩි ටික දාන්නයි, දැන්වීම් ටික ප්‍රින්ට් කරන්නයි, පන්සලේ අවට තීන්තගාන හැමතැනකම "ගාමිණී සළුපිළි මැදුර" නම ගහන්න කියන්න ඕන වැඩකරන කොල්ලෝ සෙට් එකට.

"නෝනේ නෝනේ..."

"මොකද මහත්තයා"

"මං පන්සලේ වෙසක් උත්සවය කරන්න භාරගත්තා"

"පිස්සුද මනුස්සයෝ..... කීදාහක් වියදම් වෙන වැඩද ඕවා... අපරාදේ සල්ලි... අනික ඔය දාන වේල් හරියට දෙන්නත් ඕනෑ සිල්ගත්ත ගමේ අම්මණ්ඩිලා ටිකට, නැත්තම් දානේ හරි නෑ කියලා ගම වටේ කියවාවි; මුදලාලි මහත්තයා දානේ දුන්නේ අරමයි මේමයි කියලා.........."

"පොඩ්ඩක් නවත්තා ගන්නවකෝ නෝනේ කියවිල්ල"

"ඔහේ හිතුවද මට ප්‍රතිලාභයක් නැතුව මේක භාරගත්තා කියලා; මම පන්සලේ කරන හැමදේකම අපේ අලුත් කඩේ නම ගහනවා "ගාමිණී සළුපිළි මැදුර" කියලා.... බලන බලන හැම තැනකම අපේ කඩේ නම නේ... මිනිස්සු උනත් අපේ කඩේට එනවා පිනට දහමට ලැදි මිනිස්සුන්ගේ කඩයක් නිසා..... මේවට කියන්නේ නෝනේ "ප්‍රෝමෝට් කරනවා" කියාලද කොහේද..."

"අපේ අප්පෝ..... මහත්තයාගේ මොලේ තමා කපටි මොලේ...."

...............

වෙසක් පෝයට දින හතකට කලින් පන්සලේ සැන්දෑ වරුවේ පූජාවන් පැවැත්වුණා. මේ දවස් කිහිපයේම ගමේ කතාවට ලක් වුණේ වෙන කවුරුත් නොවේ ගාමිණී මුදලාලි විතරයි. වෙසක් පෝය දවසේ උදෑසන සිට දානමාන විවිධ පූජාවන් කරලා ගාමිණී මුදලාලි මහත්තයයි නෝනායි ධර්ම දේශනාව ශ්‍රවනය කරන්න බණ මඩුවේ ඉස්සරහින්ම වාඩිවුනේ හරි උජාරුවෙන්මයි. ලොකු හාමුදුරුවෝ ධර්ම දේශනාව ආරම්භකළහ.

"පින්වත් උපාසක උපාසිකාවනි, අද උතුම් වෙසක් පෝ දවසේ..................................................................... ධර්ම දේශනාවට පාදක කරගන්නේ "ජීවිතං අනියතං - මරණං නියතං...." පාලි ගාථාව,............................

උපාසක උපාසිකාවනි අපි ජීවිතේ මිල මුදල්, නම්බු නාම, තානාන්තර රැස්කරගෙන නොමැරෙන මිනිස්සු ගානට ජීවත්වෙන්න හදනවා. බලන්න පින්වතුනේ හොඳම උදාහරණය මේ පන්සල වටපිටාවේ ම තියෙනවා. පන්සලට ලැබෙන සෑම පරිත්‍යාගයක ම".....මහතා විසින් ලබාදෙන ලදි." නම ගහලා දෙන්නේ. අපි දෙයක් කෙනෙක්ට දෙනකොට අපේ නම ගහගෙන දෙන්න ඕන නෑ. අපි හිතින් අතෑරලා දෙන්න ඕන. දැන් මේ පන්සල අවට ධජ පතාක වල ලෙළ දෙන්නේ අපේ ගාමිණී මහත්තයාගේ කඩේ නම, එහෙම නේද මුදලාලි මහත්තයෝ..? පන්සලට එන උපාසක උපාසිකාවන්ට තණ්හා ආශාවන් වලට ඇති ඇල්ම අඩුකරන්නයි අපි සිදුකරන්න ඕන. ඒත් මේ කොඩි පළදනා දැක්කාම උපාසක උපාසිකවන්ගෙන් ටික දෙනෙක් හිතේ ආශාව උපදිනවා අලුත් සළුපිළි ගන්න. තව පිරිසකගේ හිතේ ශෝකය උපදිනවා අලුත් සළුපිළි ගන්න සල්ලි නැති නිසා. මම මේ කියනදේ හැම පන්සලකටම පොදු වූ දෙයක්. පින්වතුනි, අපගේ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ අඹුදරුවන්, ඇස්, ඉස්, මස්, ලේ දන්දී පුරන ලද පාරමී බලෙන් ඇසතු බෝ මුල බුදුබව ලැබුවේ සියලු ආශාවන් ප්‍රහීනය කරලා. ඒත් අපේ පින්වතුන් බෝධීන් වහන්සේව පඬුරු වලින් වටකරලා, එක එක නමින් එන ග්‍රහ අපල දුරුවේවා, පුතා/දුව විභාගය පාස්වේවා කියලා ඉල්ලනවා. පින්වතුන් ම කල්පනා කරලා බලන්න කරන වැඩේ කොතරම්දුරට ගැලපෙනවද කියලා, බුදුහිමියන් සියල්ල අතහැරපු තැන ඉඳගෙන ඔබ ඉල්ලන දේවල් ගැන. ජීවිතේ අනිත්‍ය බව පසක් කරගෙන දිවිගෙවන විට පුහු දේවල් පසුපස හඹායන්නේ නෑ. ඉතින් මේ කරුණු කාරණා හොඳින් අවබෝධ කරගෙන යහපත් දිවියක් ගතකිරීමයි වැදගත්................."

තවත් ස්වල්ප වෙලාවක් ලොකු හාමුදුරුවෝ ධර්ම දේශනාව සිදුකර එය අවසන් කළ අතර මුදලාලි මහත්තයාට තමන් ප්‍රසිද්ධිය වෙනුවෙන් කරපු දේ පිළිබඳ ලොකු කනගාටුවක් ඇතිවුණා. ඔහු හිස් හැඟීමෙන් සුළඟට ලෙළදෙන කොඩි දිහා බලන් ඉඳලා ධර්මශාලාවෙන් එළියට ආවේ,

"ජීවිතං අනියතං - මරණං නියතං" ගාථා පදය තමාට කියාගනිමින් ය.


ටෂ්මි ශෂිප්‍රබා ගමාච්චි
දෙවන වසර
මූලය අධ්‍යයන අංශය

# වෙසගේ අසිරිය

සංසාරයේ ඇවිදිනා ගමනේ
එක් නිවහනකි මනුසත් බවේ
පිරීමට ඇති උතුම් ධනයයි
පිහිටීම බුදු දහම සරණේ

උතුම් වූ බුදු දහම සරණේ
සියලු ලෝ හට සුවය සැදුණේ
බුදුන් තෙමඟුල සිහියේ නැඟුනේ
වෙසගේ අසිරිය ලොවට පානේ

වෙසගේ මඳ නල දසත පැතිරේ
සැවොම ශෝකෙන් වෙලෙන අතරේ
සියලු සිත් සත බයෙන් ඉතිරේ
හුදකලාවේ ම වෙසඟ සැමරේ

කොරෝනා බිය දසත පැතිරේ
වෙසගේ අසිරිය ගිලිහුණාවේ
ජීවයේ අනියතය හෙලිවේ
කරපු කර්මයෙ මෙලෙස පලදේ

උතුම් වූ වෙසගේ අසිරි අප
සමරමු හුදකලාවේ සිට
සියල්ලන් සුවපත් කරන ලෙස
යදිමු අපි මේ උතුම් පෝදින

එල්.එච්.පී. නවෝද් විදුශන් කාවින්ද
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# ත්‍රිලෝකණ

සුදු ඇත් පැටවෙක් හොඬින් දරා ආ
එක් සියපතක්...
ලුම්බිණියේ සාල වනේ උපන් පිනැති
පුතෙක්....
මහමායා බිසව් සුදොවුන් රජ ලැබගත්
මහ භාග්‍යයක්....

සක්විති රජකමත් ඒකාන්ත බුද්ධත්වය
අතර පැවති ඝට්ටනයක්....
නමුදු සිද්ධාර්ථ නමින් ලොවට උතුම් වූ
අර්ථයක්....

නැත ගිහිගෙට සිත ඇදුනේ යථාර්ථය සිහි වූයේ...
යශෝධරා දේවිය හා කුළුදුල් පුතු අත් හැරියේ...
දිනක ඔවුන් යහපතකට පිහිටන අටියෙන් සිතුවේ....

කන්ථක අසු ඡන්න ඇමති සමඟින් ගිය ඒ ගමනේ...
කන්ථක අසු සමුගත්තේ උහුලනු බැරි මිත්‍රත්වෙ...

සියලු සැපත් අතැර දමා සිත ගත්තේ නිවන සොයා......
සියල් පෙරුමන් සපුරා බෝසත් හිමි බුදු වූවා...
එතැන් පටන් දත් සියල්ල කැටි කොට
පස්වග මහණුන් සහ සැට නම...
මාවත් සැටකට වැඩියා....

පන්සාලිස් වස් ඉක්ම වූ සදහම් බුදු ගුණ කඳ.....
උපවර්තන සල් උයනේ ලොවක්ම කම්පා කරමින...
උතුම් වෙසඟ පෝය දිනේ සිදුවුණි තෙමඟුල මෙලෙසට....

ඒ.පී. බුද්ධිමා පියුමාලි අඹගල
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# අරුත නුහුරු හුරු වෙසඟ

ලෝකය පුරා ථේරවාද මෙන්ම මහායාන බෞද්ධ ජනයා තෙමඟුල සිහිකරමින් වෙසක් සැමරීම් නෙක අයුරින් සිදුකළ ද ලාංකික ජනයා වෙසක් උත්සවය ඉතාමත් උත්සවශ්‍රියෙන් සමරනු දක්නට ලැබීම සුවිශේෂීත්වයකි. අද වන විට වෙසක් උත්සවය බෞද්ධ අබෞද්ධ සියලු ලාංකික ජනයා එකට එක්ව ප්‍රීති ප්‍රමෝදයට පත් වන ජාතික උත්සවයක තත්ත්වයට පත්ව ඇති බව නොරහසකි.

සිද්ධාර්ථ කුමාරෝත්පත්තියත් අප සිදුහත් බෝසතාණන්ගේ සම්මා සම්බුද්ධත්වය මෙන්ම නිදහස් ආගමික දර්ශනයක ශාස්තෲවරයෙකුගේ පිරිනිවන අනුස්මරණය කරමින් සිදු කරන වෙසක් සැමරීම සැබෑ හරයාත්මක බෞද්ධ සැමරීමක විනිවිදභාවය සපථ කරන්නේදැයි විමසා බැලීමට කාලය එළඹ ඇත.

අහස උසට ඉදිවෙන මනරම් තොරණ්, නෙක වර්ණ පහන් සැරසිලි, ජන ගංගා වලින් පිරී ඉතිරී යන දන්සල්, මහා පරිමාණ වෙසක් කලාප, ජයග්‍රාහකයන්ට ත්‍යාග පිරිනමන මහා පහන් කූඩු තරඟ, වෙසක් සැමරුමක් සඳහා සැබැවින්ම අගනේය: විචිත්‍රවත් ය.

නමුදු ගැටලුව වනුයේ වෙසක් නම් තොරණ් ය; වෙසක් නම් දන්සල් ය; ලොරි කට්ටක නැඟ ඩොල්කි ගසමින් සවාරි යන්නට නම් වෙසක්මය යන සංකල්පයකට ලාංකික ඔළුගෙඩි සැකසීම ය. හය හතර නොදත් දරුවා අත වෙසක් දින තබන නලාව ද එය පිඹින්නට ලද අනුබලයෙන් පුංචි මනස ලබන සංඥාව ය. සමරනවාට සමරන වෙසක් සැමරීම ය.

මහා ශාස්තෲවරයෙකුගේ පහළ වීම මෙන්ම සම්බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීම සැමරීමට කරුණක් වනු සැබෑ ය. නමුදු එවන් පුර පසළොස්වක පොහෝ දිනකයකම ලොවට පෑයූ ඒ ලොව්තුරු අමා සඳ බැස ගිය බව ද සැලකිල්ලට නොගැනීම විස්මිත ය. සාරාසංඛ කල්ප ලක්ෂ ගණනක් පුරාවට දැරූ සම්මා වායාමයක අවසන් ප්‍රීති ඵලය පරිනිර්වාණය වුවද බුද්ධ පරිනිර්වාණය අභියස මහ රහතුන් පවා සංවේග වූ බවට ථේර ගාථා සාක්ෂි දරන අතීත පසුබිමක දහහතර මිලියනයක ලාංකික බෞද්ධ ජනයා පන්සල් භූමි නිහඬතාවයේ ගිලී යද්දී පාරට බැස සමරන වෙසක් ගැන නම් නැවත විචාරයට ලක් කල යුතුය.

තාක්ෂණයේ දියුණුවත් සමඟ 'බෞද්ධයන්ගේ මහා දිනය' ද වාණිජකරණයට හසුව එහි බුද්ධිගෝචර දර්ශනය උකහා ගන්නට ලාංකික බෞද්ධයා අපොහොසත් වීද? හුදු සැණකෙළි සිරි මවන නාමමාත්‍රික උත්සවයක් බවට වෙසක පත්වී ද? තොරණ් බඳිද්දී ත්, විචිත්‍ර බුබුළු වලින් පන්සල් භූමි, පාර තොට සරසන එදා බෞද්ධයා සැබෑ වෙසක තුළට ආරුඪ කළ සුපහන් අරුත පසක් කරනු තබා පුරුද්දට මෙන් වටේට පෙනෙන්නට කඩෙන් ගෙනා මිල අධික කූඩු එල්ලනවාට එල්ලන නූතන බෞද්ධ සමාජය: තාක්ෂණය සමඟ මුහු වෙමින් දුවන සීඝ්‍රගාමී ඩිජිටල් ගමනක නැවත හිතන්නට අපට කාලය මදි වුනිද? සරු දහම් අපෙන් ඉවතට විසිවුනි ද?

රජය මගින් සුරා සැල් වසන්න යැයි ඇඟිල්ලෙන් ඇන නීති නොදමා ද ස්වයං විනය ඇතිව හික්මීමට ඉගෙනගත් තැනද, සුරාසැල් වසන්නට ඔන්න මෙන්න තියා බෝතල් දෙක තුන හොරාට ගෙට දමා ගෙන බජව් නටන්නට නොසිතන පිරිස බිහිවුන, අහස උසට බැඳි තොරණ් මෙන්ම නෙක වර්ණ පහන් බුබුළු ලොව්තුරු බුදුරදුන් උදෙසා වන ආලෝක පූජාවක් යයි මනසින් දැක සාධුකාර නඟන්නට දෙඅත එකට බැඳෙන දිනද, පවුලේ සැම එකට ඉඳ වෙසක් කූඩුවක් සකසා මෙය දිරන්නේ යම් සේද, එලෙසම මනුස්ස ශරීර කූඩුව ද දිරන්නේය ලෙස මෙනෙහි කරන්නට ආකල්ප වර්ධනය වන දින ද, ප්‍රසිද්ධ විහාරස්ථාන, වෙසක් කලාප පමණක් නොව ගමේ පන්සල් මිදුලද බාල තරුණ මහලු සැමගෙන් පිරී යන, තමාට තියන නිසාම හෝ දෙන්නං වාලේ නොදී දානය පාරමිතාවක් වනු වස් පුදන්නට දන්සල් විවර වන, ප්‍රතිපත්ති පූජාවට මුල් තැන දෙන දින, සැබෑ වෙසක් ලාංකික බෞද්ධයාට හමුවන බව නම් සහසුදක් සේ විශ්වාසය.

එසේනම් අප බෞද්ධයන් ලෙස සැබෑවටම වෙසක් තුළ යථාර්ථය අත්වින්ද ද? ඔබේ සංවාදයට විවෘතයි.

විනෝද්‍යා ජයසූරිය
දෙවන වසර
මූලය අධ්‍යයන අංශය

# වෙසක් වටින්නේ කිම බොදු දනන් හට....
# ගෙනහැර පාමි මෙලෙසින් සිදුවීම් අට......

වෙසක් මහේ දීපංකර    බුදුරජුගෙන්
බුදුබව ලබා ගැන්මට ලද    විවරණයෙන්
තුටු වූ ඒ මහා සුමේධ    තවුසාණන්
බුදු බව පතා පාරමිතා දම්    පිරුවෙන්

කාලය, දීපය, දේශය, කුලය    මව
අවසන් උපත බැලුවා හිමි    පෙරදීම
බිහිවුණි කුමරු සිට ලුම්බිණි    සාලවන
සත් පියුමන් මත වැඩියා කුමරු    එම

ගුණ නැණ වඩා නව විසි වසරක්    කුමරා
දුක් ඉසිලීය ගිහිගෙය හැර සයමසක්    පුරා
බුද්ධගයාවට වැඩ තිර අදිටනින්    පුරා
වෙසක් සඳේ බුදුවුණි සිදුහත්    කුමරා

වෙසක් මහේ බුදු වූ දා පටන්    කොට
කිඹුල්වතට වැඩියා හිමි මුල්    වරට
ඒ සමයේ ලක්පුරයේ    කැලණියට
පැතිරවීය දම් සිසිලස වැඩම    කොට

සව්සත හට යහපත නිති    බෙදමින්නේ
පන්සාලිස් වසරක් පුරා වැඩ    ඉන්නේ
වෙසක් සඳේ උපවර්තන සල්    උයනේ
පිරිනිවනින් මුලු තුන්ලොව    කළඹන්නේ

අනඳ හිමියෝ මහ නිවනට    පත්වීම
විජය කුමරු ලංකාවට    පැමිණීම
බෞද්ධයන් මහ පින්දම් රැස්    කෙරුම
සිදුවිය සිදුකරයි වෙසගේ    හැමදාම

ආර්.ඩබ්ලිව්.එම්.බී.පී රාජපක්ෂ
පළමු වසර
මූලා අධ්‍යයන අංශය

# විරාජිත බුදු පියාණෙනි...

තුඩින් තුඩ එකතු කර තණ්හා
අත හරිනට බැරිව....
සහසක් දොම්නස් දුක් ගිනි අතරේ
හද සැනහෙයි සිහි වන විට නව අරහාදී.....
කෙලෙස් බරිත දිවි කතර
තරණය කරනට නිතින
සසර යනු නොනිමි මගකි
නැවතුමක් නොමැති.....
පිනි බිඳක් වන් දිවිය
රියසක මෙන්
දුක සැප පෙරලෙයි එහි නිතින...
දුක විඳ එන්නෝද යන්නෝද ඇති මුත් දැක
සැප සේ නවතින්නෝ දැක නැති....
මේ සසර දනව්වේ
අසරණව ඇත.
විරාජිත බුදු හිමියනි......

ඩී. ඉමල්කා ලක්ෂානි විජයරත්න
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



කේ.පී.එච්. තාරකා
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සම්බුදු හිමිගේ ගුණ මහිමෙන් වේවා ලෝ සත සුවපත්...

ලෝසත එතෙර කරනට රුදු භව කතර
තුන්ලෝකයට පෑ කරුණා දයාබර
බුදුබව පතා විරියෙන් අවසන සසර
වෙසගේ උපන්නා බෝසත් පුත් කුමර

ගිහිගෙයි සැපත සැපතක් නැති දුක් ගඟකි
අමදිය  සොයා යන දිවි කතරේ පාපී
ගිහිසැප හැර දමා සත්‍යය සෙව් මඟකි
කෙළෙසුන් නසා වෙසඟෙහි බුදු පියුම පිපී

බුද්ධ ධම්ම සඟ තෙරුවණ සරණ ලබා
නිවුනා ලෝසතුන් දම් ගඟුලේ ගිලුනා
යලි යලි ඉපිද දුක් විඳි සැම මුල් නසලා
සම්බුදු පියාණෝ වෙසඟෙහි පිරිනිවුනා

සම්බුදු හිමිගේ මහකරුණා ගුණ බලයෙන්
කෙළෙසුන් නසා බුදු බව ලැබූ බල මහිමෙන්
තුන් ලෝ සතට සදහම් වැසි වැටුණු බෙලෙන්
දම් හඬ ඇසේවා සිව් දෙස රාව දෙමින්

ත්‍රිවිධ රත්නයේ අනුහස් බල මහිමෙන්
රුදුරු වසංගත රෝ බිය වේවා තුරන්
ලොව්තුරු දහම් ඇසුමට පණ නල රැකදෙන්
මෙත්සිත් වඩමු මෙලෙසින් එක්කර පැතුමන්

චතුරිකා සංදීපනී
තෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# වඳිමි මුනි පා පියුම්

අතිර දුක්ගිනි දවන ලෝ සත
අමාදම් දියරෙන් දොවන්නට
සියපතින් සියපතට තබමින්
සිරිපතුල් කියමින් අසිරිපද


ගෙවා කල් යල් එළඹ පසු දුටු
සිව් නිමිත්තෙන් සසල වී සිත
අදර භව බැමි සියල් හැරදා
සිත යොමා පොරවා කසාවත

නිසල කර තුන් සිතම වඩවා
බවුන් නිර්මල මසැස එක්කොට
දුශ්කර වූ පිලිවෙතින් ඇරඹූ
වීරියෙන් වඩවා දහම් පද

උතුම් වෙසඟක ලබා උත්තම
බුදු පදවි නිමකර සසර මග
අපිරිමිත කරුණා සිතින් නුඹ
දෙසූ ඒ දම්පද පසක් කොට

එතෙර වන්නට සසර කතරින්
පතා බැති සිතුවිලි පෙරටු කොට
උතුම් වෙසඟක වදිමි බුදු පා
පුදා වනපස කුසුම් විකසිත

දිනේෂා ලක්ෂිණී
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී

# ස්වර්ණ සාගරයේ සිංහාසනය රකී පන්සිල් දිවිහිමියෙන්

වෘක්ෂයකින් සිතූ පැතූ දේ ලැබෙන බව මා ඔබහට කිවතොත් එය විජ්ජාවක් ලෙස ඔබ ඇතැම්විට සිතනු ඇත. නමුත් එවැනි වූ වෘක්ෂයක් සහිත වූ දිවයිනක් මේ සක්වල තුල ඇත. බුද්ධ දේශනාවේ සඳහන් එම අරුම පුදුම දිවයිනේ වතගොත පිරික්සා බලන විට සිතට දැනෙන්නේ මහත් විශ්මයකි. ඒ වටිනා වූ උතුම් පින් බිමේ අසිරිය මෙලෙස ගෙන හැර දැක්වීමට මා හට අවසර.

මේ අරුම පුදුම දිවයිනේ නාමය උතුරුකුරු දිවයිනයි. මෙම දිවයිනට රන් පැහැයෙන් බබළන්නා වූ අහසක් සහ සාගරයක් හිමිය. අපගේ ලෝකයට උතුරු ප්‍රදේශයේ සත්කුළුපව් සප්ත සාගරවලින්ද, උතුරේ පිහිටි මහාමේරූ පර්වතයද, පසුව එයිනුත් උතුරෙන් පිහිටි සත්කුළුපව් හා සප්ත සාගරයට ද උතුරෙන් පිහිටා ඇත්තේ උතුරුකුරු දිවයිනය. මේ දිවයිනේ හැඩය නම් තරමක් වෙනස් වූ ස්වරූපයකින් යුත් සිංහාසනයක හැඩයක් ගන්නා අතර දිග, පළල ප්‍රමාණය නම් යොදුන් 8000ක් බැගින් වේ. මෙහි ප්‍රධාන රාජධානිය ලෙස විසාල නම් රාජධානියේ කුවේර නම් පුරය පෙන්වා දිය හැකිය. එහිද අප මෙන්ම මනුෂ්‍යයෝ වාසය කරති. එම මනුශ්‍යයන්ගේ මුහුණේ හැඩය අපගේ මෙන් රවුම් ස්වභාවයක් නොදරන අතර, ඒ දිවයිනේ හැඩය ගන්නේය. ඇත්තෙන්ම ඔවුන්ව අප යම් අවස්ථාවක දුටුවහොත් පිටසක්වල ජීවීන් ලෙස සලකන බව නොඅනුමානය. එහිද මනුෂ්‍යන් සිටියද, එය ඇත්තෙන්ම දිව්‍ය පුරයක් මෙනි. එම භූමිය තැනිතලා වැලි සහිත ඉතාමත් රමණීය පරිසරයකින් යුක්තය. එහි අති විශාල වූ කල්ප වෘක්ෂයක් ඇති අතර එම වෘක්ෂය විසින් එහි වෙසෙන මිනිසුන් හට සිතූ පැතූ දේ ලබාදෙන්නේය. අප නම් ජීවත් වීමට රැකියාවක්, කර්මාන්තයක් සිදුකර මුදල් උපයා නිවාස සාදා අපට අවශ්‍ය දෑ අප විසින්ම සම්පාදනය කරගනිමින් ජීවත්ව සිටියද, මෙම දිවයිනේ මිනිසුන් සිය ජීවිත පවත්වාගෙන යාම සඳහා කෘෂිකර්ම, වෙළඳාම ආදී කිසිදු කාර්යයක නිරත නොවන්නේය. මන්ද ඔවුනට අවශ්‍ය සියලු දෑ එම කප්රුක තුළින් පහළ වන නිසාවෙනි. එලෙස සිදුවන්නේ කෙලෙසද යන්න උපමාවකින් කිවතොත්, ඔවුන් ඒ වෘක්ෂය වෙත ගොස් අත දිගුකර යම් දෙයක් පැතුවහොත් එය ඒ අවස්ථාවේම පහළ වන්නේය. තවද, අපට මෙන් රෝග, ව්‍යාධි, කළහා, ක්‍රෝධ, ද්වේශ, මෝහ වැනි දෑ ඔවුන් තුළ නොමැත. අපට මෙන් වැස්සෙන් පින්නෙන් ආරක්ෂා වීමට ගෙවල්, මැදුරු ආදිය ඔවුනට නොමැත. වැසි වැසොත් එම වැහි දිය සුළඟින් මුහුදට ගලායන්නේය. මද පවන සිසිල ඇති හෙයින් නිවාස අවශ්‍ය නොවේය. සොර සතුරු උවදුරු නැති හෙයින් ආරක්ෂක පුවරු අනවශ්‍යය. අපගේ මෙන් විසකුරු සතුන්, මැසි මදුරුවන්, රුදුරු වන සිවුපාවන් නැතිහෙයින් එමගින්ද පීඩාවන් ඇති නොවේ. මව්පිය නෑදෑ සහෝදර සහෝදරියන් කියා වෙනසක් නොමැතිය. එහි වෙසෙන සෑම දෙනාම එකිනෙකාට සියල්ලෝම මව්පිය, සහෝදර, මිත්‍ර භාවයෙන් වාසය කරති. යම් පුතෙකුට සිය මව හමුවූ විට පියයුරු තුළින් කිරි විහිදෙන හෙයින් එම පුතු හට සිය මව හඳුනාගත හැකි අතර, දියණියකට පියා හමුවූ විට පියාගේ පියයුරු තුළින් කිරි විහිදෙයි. එම සලකුණු වලින් දූදරු මව්පියන් අතර කාම සම්භෝගය වැළකේ. අප නම් දරුවකු ඉපදෙන විට දැක ඇත්තේ රුධිර වහනයක් සිදුවෙමින් ද ඇතැම් අවස්ථාවල ඉතා වේදනාකාරී ස්වභාවයන්ටද මව්වරු මුහුණදෙන ආකාරයයි. නමුදු මේ දිවයිනේ දරු ප්‍රසූතියකදී කුණු කසලයන්ගෙන් තොරව අවශ්‍ය වූ විට පහසුවෙන් ප්‍රසූතිය සිදුවන්නේය. සෑම දරුවෙකුටම හැම ස්ත්‍රියක්ම මව්වරුන් සේ සලකති. එහි වෙසෙන සෑම මනුෂ්‍යයෙක්ම දිවි හිමියෙන් පන්සිල් රකිති. අවුරුදු දහසක් පමණ කාලයක් ජරා විලිපිලි නොමැතිව ජීවත්ව සිට, මිය ගිය කල ස්වර්ණාභරණයෙන් සරසා පෙර සඳහන් කළ විශාල කල්ප වෘක්ෂයෙන් පහළ වන දිව්‍ය සළුපිළි සාදවා අමු සොහොනට ගෙන ගොස් හරිති. එම මිනිය හිමාලයේ වෙසෙන්නාවූ ඇත් ගිජුලිහිණියෝ ගෙන ගොස් යුගාන්දරාදී පර්වත වලට විත් අනුභව කරති.

එලෙසටම, ජීවක වෙදතුමා විසින් අප මහා බුදුරජාණන් වහන්සේ හට පාංශුකූලික චීවරය වශයෙන් ප්‍රථමයෙන් පිළිගන්වන ලද්දේ ද, ඉහත කී උතුරුකුරු දිවයිනේ සිට මිනියක් ඇත්කඳ ලිහිණියකු විසින් හිමාලයට උඩින් ගෙන යනවිට වැටී ගිය එම මිනිය වසාලූ දිව සළු දෙකකි. අප මහා ලොව්තුරා අමාමෑණී බුදුරජාණන්වහන්සේ උරුවෙල කාශ්‍යප දමනයේ දී දානය ලබා ගැනීම සඳහා මෙම උතුරුකුරු දිවයිනට වැඩි සේක. කාලිංග චක්‍රවර්ති, මහාමන්දාතු යන රජවරු, චක්‍ර රත්නය මගින් මේ දිවයිනට ගොස් යළි අපගේ ජම්බුද්වීපයට පැමිණියෝය. ඇත්තෙන්ම මෙහි වෙසෙන කිසිදු අයෙක් දුක යන්න කුමක්දැයි නොහඳුනති. අධර්මය නොමැති පන්සිල් දිවිහිමියෙන් රක්නාවූ යහපත් මෙත් සිතුවිලි වලින් පරිපූර්ණ අය සිටින නිසාවෙන් ධර්මය අවබෝධ කිරීම සඳහා බුදුවරු, මහරහතන් වහන්සේලා නූපදිති.

ඇත්තෙන්ම එවැනි උතුම් දිවයිනක් කෙතරම් අපූරුද. නවීන තාක්ෂණය මුහුකුරා ගිය දැනුම ඇති අපගේ මිනිසුන් හට එවන් වූ පින්බිමක් තවමත් හමුවී නොමැත. තාක්ෂණය සමඟ එක්ව ඩිජිටල් ලෙස සංවර්ධනය වන මිනිසා හට ඇතැම් මානුෂීය ගුණාංග බොහෝමයක් ඈත්ව අදිසි ලෝකයක අතරමංව සිටී. විටෙක ඒ තාක්ෂණය තුළ සිත් වසඟ කරන්නාවූ අපූර්වත්වයක් පැවතුන ද ඒ තුළ සැඟව සිටින අදිසි රකුසා මහත් බියකරුය. ඒ තුළ මෙලොවට මෙන්ම පරලොවට ද අවැඩක් වන්නා වූ තාවකාලික වින්දනයන් ලැබීමට අප බොහෝ දෙනෙක් යොමුව සිටී. බුද්ධ දේශනාවේ සඳහන් වූ එම දිවයින අපගේ නෙතට දෘශ්‍යමාන වූවානම් කෙතරම් භාග්‍යයක්ද. නමුදු ස්වභාවධර්ම මෑණියන් විසින් එය අපගෙන් නොපෙනෙන්නට දුරස්ව තබා ඇත. එවන් වූ දිවයිනක, එයටත් වඩා සැප සම්පත් පිරි දිව්‍ය බ්‍රහ්ම ලෝකවල ඉපදීමටද, ඒ සා මහත් සැප සම්පත් පරයායන සියල්ලන්ටම වඩා උතුම්වූ සැපය වන නිර්වාණ අවබෝධය ලබා ගැනීමට අප සියලු දෙනා වහ වහා කුසල් දහම් වැඩිය යුතුය. නැතහොත් අටමහා නරකයේ පැසෙමින්, තිරිසන්, අසුර, ප්‍රේත යනාදී ලෝකවල ඉපිද අනේක විද දුක් කම්කටොළු විඳිමින් සසර දනව්වේ සැරිසැරීමට මටද, ඔබටද සිදුවනු ඇත. බුද්ධ දේශනාවට අනුව,

"අප්පමාදෝ අමතපදන් - පමාදෝ මච්චුනෝ පදන්
අප්පමත්තාන මීයන්ති - යෙ පමත්තා යතා මතා"

"නොපමා බව නිර්වාණයට කරුණුය. පමා බව මරණයට කරුණුය, නොපමාවූවෝ නොමියෙති.යම් කෙනෙක් ධර්මයේ පමා වන්නේද, ඔහු මළවුන් වැනිය."

ලිපියේ අවසානයට මත්තෙන් මාගේ සිතට නැගෙන සිතුවිල්ලක් මෙසේ වචන කිරීමට කැමැත්තෙමි.

ලැබ ඇති මිනිස් බව අපහට — අගනේය
වඩනුව සිල් පින්දම් රැස්කොට — වටිනේය
කරතොත් පව්ටු ජඩ වැඩ ඔබ — දුදනේය
පැසි පැසි සිටී ඔබ අටමහ — නරකේය

උතුම් වූ පින්බර වෙසක් මහේ පින්දහම් කෙරුමට සැමට සිත් පහළ වේවා..
තෙරුවන් සරණයි.

රසිනි ධර්මසේන
දෙවන වසර
මූලය අධ්‍යයන අංශය

ඉඳුරන් තව තවා වුණු තැන්වල නතර
කඳුලෙහි පවා තෙතමනයක් නැති අතර
බුදු හාමුදුරුවනි, මම මේ වැලි කතර
නුදුටිමි අමා මහ නදියක් ඔබ විතර

අහමඩ් සුෆර්
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය



අයි.එන්.ටී. කුමාරගේ
පළමු වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# සාංසාරික ප්‍රේමය අතහැර නික්ම යාම.

නිමක් නොවෙනා කල්ප අතරේ
පෙමින් වෙලුනේ කුමරු මසිතේ
සයුර ගැඹුරට සෙනෙහේ දෙසිතේ
කුමරු රාහුල එළිය දුටුවේ.
සසර පෙර නිමිති දැකලා දුක්වන්න.
ලෝ වැසියාට සෙත් සලසා පිහිටක් වන්න.
අදිටන එයයි දැක එය මා තුටුවන්න.
කිරිකැටි සිනහ දැක කෙලෙසක මා නවතින්නේ
උහුලනු බැරිව දුක් ගිනි
උණු කඳුලැලි එන්නේ
නුබේ අදිටනයි
මට ඕනෑ වන්නේ
සත්‍ය සොයා
ජය ටැඹ වෙත නික්මෙන්නේ..

ජී. වී. එසදි හසින්තයා
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

# තෙමඟුලේ අසිරිය සිහිකරමු.

උත්පත්තිය කිඹුල්වත් පුරේ වූවා
බුද්ධත්වය බුද්ධගයාවේ වූවා
පිරිනිවන කුසිනාරාවේ වූවා
බුදු තෙමඟුල වෙසක් මහේ දී වූවා

කිඹුල්වත් පුරට සුද්ධෝදන රජෙකු වුණි
දේවිය මහමායා දෙව්දහ නුවර වුණි
වෙසක් මල් පිපී දෙරණම එළිය වුණි
සල් මල් තුරු මැදින් බෝසත් උපත වුණි

ගම් දනව් සිසාරා සම්බුදු බණ දෙසමින්
සසර කෙලවර නිවනට මඟ සදමින්
මෙත් කරුණා ගුණ දසතට විහිදුවමින්
නොනැසෙන බුදු වදන් දෙසුවේ කරුණාවෙන්

බෝසත් කුමරු මෙත්තා ගුණ දම් වැඩුවා
සියලු ලෝ සතුන් වෙත කරුණා දැක්වූවා
තණ්හා රති රඟා දූවරු පැරදූවා
වෙසක් පොහෝ දින සිදුහත් බුදුවූවා

ඉපදී පටන් දම් සුවඳක් ලොව හැමුවා
බුදු වූ දා පටන් සම්බුදු බණ දෙසුවා
පරිනිර්වාණය තෙක් නිවනට මඟ දෙසුවා
සැම සිත් සනසලා බුදු හිමි නිහඬ වූවා

චමෝදනී ගයන්ත්‍රී
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය

සකුණ තෙන්නකෝන්
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



# අරමුණ කරා දැඩි අදිටනින්....

"මේ මහා පුරුෂයා වෛශාක්‍ය දිනයේදී මව් කුසින් මේ
මනුලොව උපන්නෙකි. මමද මව්කුසින් උපන්නෙක් වුවද
උන්වහන්සේ තම ඒකායන ශ්‍රේෂ්ඨ අරමුණ සාක්ෂාත්
කරගැනීම උදෙසා අනන්ත කැපකිරීම් කළ සේක. තම
අරමුණට අදාළ නොවන සියලු දේ "අළුයම හෙළු කෙල පිඬක්" සේ,
අත්හළ සේක. ඒ ශ්‍රේෂ්ඨ උතුමා අනුව යමින් මමද මාගේ ඒකායන
අරමුණ උදෙසා අනන්ත කැප කිරීම් කරන්නට අදිටන් කරමි. මාගෙ
ශ්‍රේෂ්ඨ අරමුණට අදාළ නොවන සියල්ල අත්හරිමි.
ඔබ වහන්සේ තමා අභියස සපැමිණි කිසිදු බාධකයක් නිසා
අරමුණ අත් නොහැරි සේක. මමද බාධකයන්ට ආශිර්වාදයක් වෙමි.
ඒ බාධකය ඉදිරියේ නොසැලී නොනැවතී ඉදිරියට
යාමට මම අදිටන් කර ගනිමි. තමා ඉදිරියට පැමිණි අටලෝ
දහම ඉදිරියේ ඔබ වහන්සේ නොසැලී සිටි සේක. ඒ අනුව යමින්
මමද එසේ නොසැලී ඉදිරියට යාමට දැඩි වීර්යයෙන් යුතුව
කටයුතු කරමි. එය මට හැකිය යන්න මම දැඩි විශ්වාස කරමි.
ඔබ වහන්සේ වෙනුවෙන් මමද මගේ යහපත් ඒකායන අරමුණ
වෙනුවෙන් දැඩිව කැප වෙමි.මගේ අරමුණට බාධක වන සැප සම්පත්
ආදී සියලු දේ අත් හැරීමට පසුබට නොවෙමි. ඔබ වහන්සේ මෙලොවට
ජනිත කළ දෙමාපියන්ට කළ දැඩි ගෞරවය මම අගය කරමි. ඒ අනුව යමින්
මගේ දෙමාපියන්ට ගෞරවයක් වෙමින්, මාගේ උතුම් අරමුණ
ජයග්‍රහණය කොට මාගේ මාතෘ භූමියට උතුම් ගෞරවයක් ගෙන දෙමි"

සංදීප මාපලගම
දෙවන වසර
මූල්‍ය අධ්‍යයන අංශය



සදහම් අමාකරුණු විමසනු වස්...

# වෛශාඛ්‍යාර්ථ ප්‍රහේලිකා

උතුම් වූ බුද්ධ ජයන්තිය සමරනු නිමිත්තෙන්, දහම් දැනුම වැඩි දියුණු කරනු වස්, කැලණිය විශ්වවිද්‍යාලයේ මූලය අධ්‍යයන අංශයේ ශිෂ්‍ය සංගමය විසින් සම්පාදිත 'වෛශාඛ්‍ය වර්ණනා' සඟරාවට සමගාමීව සංවිධානය කරනු ලැබූ 'වෛශාඛ්‍යාර්ථ ප්‍රහේලිකා' සදහම් පැන විසඳුම් සමඟ එක්වීමට සියලු සැදැහැවත් බෞද්ධ ප්‍රජාවට කෙරෙන බැතිබර ආරාධනය යි.

මේ සඳහා පහත සඳහන් ප්‍රහේලිකාව නැවත පිටපත් කර සම්පූර්ණ වශයෙන් ම පුරවා, Scan හෝ PDF කරන ලද පැහැදිලි ඡායාරූපයක් පහත සඳහන් සබැඳිය ඔස්සේ ජුනි මස 03 වන දිනට පෙර අප වෙත යොමු කළ යුතුය.

පහත ප්‍රහේලිකාව පුරවා අප වෙත පිළිතුරු එවීමෙන් පසු, එම පිළිතුරු අතරින් අහඹු ලෙස තෝරගන්නා ලද ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා ඔවුන්ගේ දහම් දැනුම ඇගයීමේ අරමුණින් වටිනා මුදල් ත්‍යාගයන් පිරිනමනු ලැබේ.

**හරහට**

1) කෝට්ටේ යුගයේදී රණස්ගල්ලේ හිමි විසින් රචිත කාව්‍ය ග්‍රන්ථයකි.
5) අකුසල මූලයකි.
7) බුදු සසුනේ ශ්‍රද්ධා සම්පත්තියෙන් අගතැන්පත් බව ලැබූ මහ රහතන් වහන්සේ ය.
9) අවිද්‍යාව ධර්මය තුළ මෙනමින් හැඳින්වේ.
13) සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළ රාජ්‍යය යි.
14) මහා බ්‍රහ්මයා සතු ගුණාංගයකි.
16) පංච නීවරණ ධර්මයන්ගෙන් එකකි.
17) බුදුරජාණන් වහන්සේගේ දින චර්යාව අනුව දවස බෙදා වෙන්කළ කොටස් ගණන වේ.

**පහළට**

1) විවිධ අවස්ථා හා අරමුණු අනුව පහළ වන සිත්, අභිධර්මයේදී ප්‍රභේදනය වන ආකාරයකි.
2) විනයධර භික්ෂුණීන් අතර අගතැන්පත් උත්තමාවියගේ ගිහිකල නාමය යි.
3) ශරීරයෙන් එකවර ජලය හා ගිනි දැල් පිටවන, බුදුවරයෙකුට පමණක් කළ හැකි ප්‍රාතිහාර්යය කි.
4) කුඩා අනුකුඩා ශික්ෂා පද ඇතුළත් සූත්‍ර ධර්ම නිකායකි.
8) බුද්ධත්වයෙන් අටවෙනි මස ලංකාවට වැඩි බුදුරදුන් සමන් දෙවියන්ට පරිත්‍යාග කළේ ................ ධාතුව යි.
10) සොළොස් මහා ජනපද වලින් එකකි.
11) සිත, කය හා වචනය මුල් කරගෙන සිදු කරන සචේතනික ක්‍රියා මෙනමින් හැඳින්වේ.
12) අධිසිල් සහිත උපසම්පදා භික්ෂුවකගේ චීවරය ඉවත් කිරීමට හේතු වන කරුණු ඇතුළත් වන්නේ ........... න් හීය.
13) අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා අරභයා බුදුරදුන් විසින් දේශනා කළ සුත්ත නිපාතයේ ඇතුළත් සූත්‍රය කි.
15) සිඟාලෝවාද සූත්‍රයේ සේවක - සේව්‍ය සබඳතාව නිරූපණය වන දිශාව යි.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | කෝ | 2 | | | 3 | ■ | ■ | 4 | ■ | 8 |
| | ■ | | ■ | ■ | මා | ■ | ■ | 5 ද | | |
| | ■ | චා | ■ | ■ | | ■ | ■ | | ■ | ■ |
| | ■ | | ■ | 9 | | ය | ■ | 14 | | ණා |
| ර | ■ | ■ | ■ | ■ | | ■ | 10 | ■ | ■ | ■ |
| ■ | ■ | ■ | ■ | ■ | | ■ | 7 | | 11 | |
| ■ | ■ | 12 | ■ | 17 ප | | ■ | | ■ | ඊ | ■ |
| ■ | ■ | රා | ■ | ■ | | ■ | ති | ■ | | ■ |
| 13 | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | | ■ |
| ස | ■ | 16 | | | ඡ | | | 15 | ■ | ■ |
| | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | ■ | ■ |

https://forms.gle/bx3UYfYadKMxDKHJ7

දැවෙන මනු සිත් අමා දහරින් නිවාලනු වස් කැලණිය විශ්වවිද්‍යාලයීය මූල්‍ය ශිෂ්‍ය සංගමය විසින් ඉදිරිපත් කරනු ලබන වෛශාක්‍ය වර්ණනා වාර්ෂික විද්‍යුත් දහම් සඟරාවේ දෙවන වෙළුම සඳහා තම සැදැහැති දායකත්වය ලබාදෙමින් ආසිරි එක්කරන ලද්දේ,

රාග ද්වේශ මෝහාන්ධකාරයන් දුරු වේවා.. සිත් සතන් ආලෝකමත් වේවා.. කරුණා ගුණය ලොව පැතිරේවා.. නූපන් කුසල් ඉපදේවා.. නිවන නම් වූ ක්ෂේම භූමිය වැඩි ඈතක නොවේවා..
සම්බුදු තෙමඟුල සමරමු බැතියෙන්...!
IMS අධ්‍යාපන ආයතනය
මහනුවර

දම් සිසිලෙන් සිත් සැනසෙන පින්බර වෙසක් මංගල්‍යයක් වේවා !
හේමමාලා කරුණාසේකර මිය (CFO)
කැලණි කේබල්ස්

සිතුවිල්ලෙන්ම සිත් පහන් වේවා !
ධර්මදාස කන්ස්ට්‍රක්ශන්

සියලු සත්ත්වයෝ
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
පමිත් එන්ටර්ප්‍රයිසස් / ආර්. ආර්. ප්‍රියංකර මහතා
නො:49/12/A/1, මිරිස්වත්තහේන, වටද්දර, වේයන්ගොඩ.

මෝහාන්ධකාර සිත් ධර්මාලෝකයෙන් බැබළේවා !
සුමග මෝටර්ස් & සර්විස් සෙන්ටර් / පී. ජී. එස්. එන්. පෙරේරා මහතා
නො:70/B, වටද්දර, වේයන්ගොඩ.

වෛරයේ ගිනිදළු නිවා සියලු සත සුවපත් වේවා !
සොලිඩ් ස්ක්‍රීන් / ප්‍රියංකර ඩී. කොස්තා මහතා
නො:18/A, නුවර පාර, කළගෙඩිහේන.

උතුම් වූ දැහැමියාවකට පියවර නැගේවා !
ආසිරි බිල්ඩින් කන්ස්ට්‍රක්ශන්ස් / වයි. ඒ. වයි. එස්. නවීන්ද්‍ර යාපා මහතා
නො:418, උඩුපිල, දෙල්ගොඩ.

දහම් පහනින් මනුදම් දැල්වෙන, අමා ධ්වනියේ නද මනු සිත් තුළ වැයෙන පින්බර වෙසඟකට ආසිරි !
ඉසුරු රයිස් මිල්ස්
වදුරැස්ස, විතිකුලිය.
0775142207

ඒ. ඩබ්. එල්. ජයතිලක මහතා,
බුත්තල.
0701815643

සහන පොත්හල
අහංගම පාර, ඉමදුව.

ඔප්‍රෝමා කොස්මැටික්ස් ප්‍රයිවට් ලිමිටඩ්.
නො.223/1, බටහේන පාර,
කිරිකිත්ත, වැලිවේරිය.

සම්බුදු සිසිලෙන් මුළු විශ්වයම නිවී සැනසෙන පින්බර වෙසක් මංගල්‍යයක් වේවා !
පී. ආර්. සී. ගමගේ මහතා
සුජිත චමිල් මහතා
පී. කිරින්ද මහතා
රම්‍යා මිය
එච්. කේ. නිශාන්ත සංජීව මහතා
අනුර ස්ටෝර්ස්



කැලණිය විශ්වවිද්‍යාලයීය
මූල්‍ය ශිෂ්‍ය සංගමයේ
ප්‍රකාශනයකි.

https://www.facebook.com/FinanceStudentsAssociation

https://www.linkedin.com/company/finance-students-association-university-of-kelaniya/

https://www.youtube.com/c/DepartmentofFinanceUOK